

බදු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශය

2025/2026

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

2026 නොවැම්බර් 12



බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය
2025/2026

2024 අංක 44 දරන රාජ්‍ය මුල්‍ය කළමනාකරණ පනතේ

20(2)(ඌ) වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

2026 නොවැම්බර් 12

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදුව, කොළඹ 08 ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණාලයේ මුද්‍රණය කර, ශ්‍රී ලංකාව, කොළඹ 01, මහ ලේකම් කාර්යාලයේ පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

CM 45746 - 180 (2026/10) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

බදු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශය - 2025/2026

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20(2)(ඌ) වැනි වගන්තිය යටතේ දක්වා ඇති පරිදි බදු සහන ලබාදීම හේතුවෙන්, මේ දක්වා අහිමි වූ ආදායම් සහ නව සහන ලබාදීම හේතුවෙන් අහිමි විය හැකි ආදායම් ඇතුළුව මුළු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශයක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

පටුන

සංක්ෂිප්ත සාරාංශය

I වන කොටස - බදු ආදායම් අභිමිවීම සහ මූලික බදු ක්‍රමය

1 වන පරිච්ඡේදය - හැඳින්වීම

1.1 සමාලෝචනය 3
1.2 අරමුණ සහ විෂය පථය 3
1.3 බදු ආදායම් අභිමිවීම අර්ථ දැක්වීම සහ වර්ගීකරණය 3
1.4 මූලික බදු ක්‍රමය 4
1.5 ව්‍යුහාත්මක සහන 10
1.6 අභිමිවන බදු ආදායම් තක්සේරු කිරීම 12
1.7 2025 වසරේ නොවැම්බර් මස ප්‍රකාශයට පත්කරන ලද බදු ආදායම අභිමිවීම පිළිබඳ ප්‍රකාශයේ සිට මෙම ප්‍රකාශය දක්වා සිදුව ඇති වෙනස්කම් 12
1.8 සීමාවන් සහ දත්ත සලකා බැලීම් 13
1.9 ඉදිරි මඟ: ඇගයීම සහ ප්‍රතිසංස්කරණ 14

II වන කොටස - බදු ආදායම් අභිමිවීම පිළිබඳ ඇස්තමේන්තු

2 වන පරිච්ඡේදය - බදු වර්ගය අනුව බදු ආදායම් අභිමිවීම පිළිබඳ සමාලෝචනය සහ විශ්ලේෂණය

2.1 සංස්ථාපිත ආදායම් බද්ද 18
2.2 පුද්ගල ආදායම් බද්ද 19
2.3 එකතු කළ අගය මත බද්ද 19
2.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 22
2.5 නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද 24
2.6 රේගු ආනයන බද්ද 25
2.7 මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද 26
2.8 නිගමනය 27

III වන කොටස - බදු ආදායම් අභිමිවීම පිළිබඳ ඇස්තමේන්තු

3 වන පරිච්ඡේදය - බදු ආදායම් අභිමිවීම පිළිබඳ සම්පූර්ණ ලේඛනය

3.1 සංස්ථාපිත ආදායම් බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය 31
3.2 පුද්ගල ආදායම් බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය 33
3.3 එකතු කළ අගය මත බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය 35
3.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය 46
3.5 නිෂ්පාදන බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය 65
3.6 රේගු ආනයන බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය 66

රූප සටහන්

රූප සටහන 2.1 : වාර්තාකරණ කාලපරිච්ඡේදය අනුව අභිමි වන බදු ආදායම් සාරාංශය 18
රූප සටහන 2.2 : පුද්ගල ආදායම් බදු අභිමි වීම - 2024/2025 19

වගු

I වන කොටස - බදු ආදායම් අහිමිවීම සහ මිණුම් සළකුණු කළ බදු ක්‍රමය

වගුව 1.1 : බදු වර්ගය අනුව පොදු බදු ආදායම් අහිමිවීම සඳහා උදාහරණ 4

වගුව 1.2 : බදු ආදායම් අහිමිවීම වර්ගීකරණය 4

වගුව 1.3 : බදු ආදායම් අහිමිවීම සඳහා වන ප්‍රධාන ප්‍රතිපත්තිමය තාර්කිකත්වයන් 5

වගුව 1.4 : මූලික බදු ක්‍රමයේ පරාමිතීන් පිළිබඳ සැකෙවින් 6

වගුව 1.5 : පුද්ගල ආදායම් බදු : මූලික අනුක්‍රමික බදු අනුපාත ව්‍යුහය 8

වගුව 1.6 : ශ්‍රී ලංකාවේ බදු ක්‍රමයේ ව්‍යුහාත්මක සහන 10

වගුව 1.7 : ශ්‍රී ලංකාවේ බදු අදායම අහිමිවීම් වාර්තාකරණ පිළිවෙත් සහ ජාත්‍යන්තර යහපත් පරිවයන් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය 14

II වන කොටස - අහිමි වන බදු ආදායම් ඇස්තමේන්තු

වගුව 2.1 : බදු වර්ගය අනුව අහිමි වන බදු ආදායම 17

වගුව 2.2 : සංස්ථාපිත ආදායම් බදු අහිමිවීම 18

වගුව 2.3 : පුද්ගල ආදායම් බදු අහිමිවීම 19

වගුව 2.4 : අහිමි වන එකතු කළ අගය මත බදු ආදායම් සාරාංශය 20

වගුව 2.5 : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් සඳහා අංශ අනුව එකතු කළ අගය මත බදු ආදායම් අහිමිවීම 20

වගුව 2.6 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා අංශ අනුව එකතු කළ අගය මත බදු ආදායම් අහිමිවීම 21

වගුව 2.7 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අංශ අනුව අහිමිවන එකතු කළ අගය මත බදු ආදායම 21

වගුව 2.8 : සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීමේ සාරාංශය 22

වගුව 2.9 : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් සඳහා අංශ අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම 23

වගුව 2.10 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා අංශ අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම 23

වගුව 2.11 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අංශ අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම 24

වගුව 2.12 : කොළඹ වරාය නගර ව්‍යාපෘති සඳහා අංශය අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම 24

වගුව 2.13 : නිෂ්පාදන බදු ආදායම් අහිමිවීම 25

වගුව 2.14 : අංශ අනුව රේගු ආනයන බදු ආදායම් අහිමිවීම 26

වගුව 2.15 : මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු ආදායම් අහිමිවීම 27

සංක්ෂිප්ත සාරාංශය

2025/2026 බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය මඟින්, මූලික බදු ක්‍රමය හා සැසඳීමේ දී විශේෂ සහනදායී සැලකීමක් ලබා දෙන බදු විධිවිධාන හේතුවෙන් රජයට අහිමි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇති බදු ආදායම ඉදිරිපත් කරනු ලබයි. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20(2)(ඌ) වගන්තියට අනුකූලව සකස් කරන ලද මෙම ප්‍රකාශය, රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය, වගවීම සහ දත්ත මත පදනම් වූ බදු ප්‍රතිපත්ති සඳහා රජයේ කැපවීම නැවතත් තහවුරු කරයි.

බදු ආදායම් අභිමිවීම රාජ්‍ය සම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලියේ වැදගත් අංගයක් ලෙස සැලකේ. සෘජු වියදම් හරහා පමණක් නොව, බදු නිදහස් කිරීම්, අඩු කිරීම්, දීමනා, වරණීය අනුපාත, බදු විරාම, බදු බැර, ආපසු ගෙවීම් සහ බදු කල් දැමීම්, බදු ක්‍රමය තුළින් ද ලබා දීම මඟින් රජයයන් ආර්ථික, සමාජයීය සහ සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කරයි. එවැනි ක්‍රියාමාර්ග මඟින් නීත්‍යානුකූල ප්‍රතිපත්තිමය අරමුණු ඉටු කර ගැනීමට හැකි වුවද, ඒවා රජයේ ආදායම අඩු කිරීමට හෝ කල් දැමීමට හේතු වන බැවින්, එය එතරම් පැහැදිලිව නොපෙනෙන ස්වරූපයේ මහජනයා වෙත දක්වනු ලබන සහයෝගයක් ලෙස සැලකේ.

2025/2026 බදු ආදායම් අභිමිවීමේ ප්‍රකාශය, 2024/2025 බදු ආදායම් අභිමිවීමේ ප්‍රකාශය තුළ ස්ථාපිත කරන ලද රාමුව මත ගොඩනැගී ඇති අතර, බදු ආදායම් අභිමිවීම් හඳුනා ගැනීම, වර්ගීකරණය කිරීම සහ ගණනය කිරීම තවදුරටත් ශක්තිමත් කර ඇත.

මෙම ප්‍රකාශය මඟින් සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, නිෂ්පාදන බද්ද, රේගු ආනයන බද්ද සහ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද ආවරණය කරයි.

බදු ආදායම් අහිමි වීමේ සාරාංශය

රු. මිලියන

සෘජු බදු	**අහිමිවන බදු ආදායම**	
	2023/24	**2024/25**
සංස්ථාපිත ආදායම් බද්ද	119,290	186,069
පුද්ගල ආදායම් බද්ද	10,461	36,278

වක්‍ර බදු	**අහිමිවන බදු ආදායම**			
	2023	**2024**	**2025**	**2026 පළමු භාගය**
එකතු කළ අගය මත බද්ද	-	333,295	419,251	242,954
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	-	-	216,283	135,270
නිෂ්පාදන බද්ද (විශේෂ විධිවිධාන)	-	9,967	16,254	9,023
රේගු ආනයන බද්ද	-	138,426	144,473	74,247
මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද	480	1,800	-	-

මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව

සටහන: ඇස්තමේන්තු විවිධ බදු කාල සීමාවන්ට සහ ඇස්තමේන්තු පාදකවලට අදාළ විය හැකි බැවින්, අදාළ වාර්තාකරණ කාල සීමාව සහ ක්‍රමවේදය කෙරෙහි නිසි අවධානය යොමු කරමින් ඒවා අර්ථ නිරූපණය කළ යුතුය.

මෙම ප්‍රකාශය මඟින් ආදායම් - අභිමිවීමේ ප්‍රවේශය (revenue-forgone approach) අනුගමනය කරනු ලබන අතර, ඒ යටතේ ඇස්තමේන්තුගත රාජ්‍ය මූල්‍ය පිරිවැය වන්නේ, ඇස්තමේන්තු කිරීමේ දී යොදා ගත් උපකල්පනවලට යටත්ව පවතින ක්‍රමවේදය යටතේ ගෙවිය යුතු බදු සහ අදාළ මූලික මිනුමක් යටතේ ගෙවීමට සිදුවන බදු ප්‍රමාණය අතර පරතරය වේ. ඒ අනුව, බදු ආදායම් අභිමිවීමේ ඇස්තමේන්තුවක් අදාළ ප්‍රතිපාදනය අභෝසි කළහොත් අනිවාර්යයෙන්ම ලැබෙනු ඇතැයි අපේක්ෂා කළ හැකි ආදායම පිළිබඳ ඇස්තමේන්තුවක් ලෙස අර්ථ දැක්විය යුතු නොවේ. බදු ගෙවන්නාගේ හැසිරීම, ආයෝජනය, පරිභෝජනය, අනුකූලතාව සහ අනෙකුත් ආර්ථික තත්ත්වයන්හි වෙනස්වීම් සැබෑ ආදායම් ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

තවද, මෙම ප්‍රකාශය මඟින් බදු ආදායම් අභිමිවීම සහ ව්‍යුහාත්මක සහන අතර පැහැදිලි වෙනසක් ද දක්වා ඇත. න්‍යායාත්මක හෝ සරල කරන ලද බදු පදනමකට සාපේක්ෂව බදු අඩු කරන සෑම ප්‍රතිපාදනයක්ම බදු ආදායම් අභිමිවීමක් ලෙස නොසැලකේ. සාමාන්‍ය අඩු කිරීම්, අනුක්‍රමික බදු අනුපාත ව්‍යුහයන්, ලියාපදිංචි වීමේ සීමාවන්, ද්විත්ව බදුකරණය හෝ බදු මත නැවත බදු පැනවීම (cascading) වැළැක්වීමේ යාන්ත්‍රණ සහ ඇතැම් ජාත්‍යන්තර වගකීම් වැනි බද්දක් සකස් කිරීමට සහ ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන ප්‍රතිපාදන, සුදුසු අවස්ථාවල දී ව්‍යුහාත්මක ලක්ෂණ ලෙස සලකනු ලැබේ.

එක් එක් බදු ආදායම් අභිමිවීමේ ස්වරූපය හඳුනා ගැනීමට අමතරව, 2025/2026 බදු ආදායම් අභිමිවීමේ රාමුව මඟින් ආයෝජන ප්‍රවර්ධනය, රැකියා උත්පාදනය, අපනයන සංවර්ධනය, ආංශික හෝ ප්‍රාදේශීය සංවර්ධනය, සමාජ ආරක්ෂණය, අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා දැරිය හැකි මිලකට ලබා ගත හැකි වීම, නවෝත්පාදනය, පාරිසරික අරමුණු සහ ජාත්‍යන්තර බැඳීම් වැනි තර්කානුකූල ප්‍රතිපත්තිමය හේතු ද හඳුනා ගනී. මෙමඟින් එක් එක් බදු ආදායම් අභිමිවීම්වල රාජ්‍ය මූල්‍ය පිරිවැය, අපේක්ෂිත ප්‍රතිපත්තිමය අරමුණු හා සමගාමීව සලකා බැලීමට ඉඩ සැලසේ.

එක් එක් බදු ගණනය කිරීමේ ක්‍රියාමාර්ගවල යෝග්‍යතාවය ස්වයංක්‍රීයව ඇගයීමට ලක් කිරීමකට වඩා, මෙම ප්‍රකාශය මූලික වශයෙන් විනිවිදභාවය සහ විශ්ලේෂණාත්මක මෙවලමක් ලෙස කටයුතු කෙරේ. රාජ්‍ය මූල්‍ය පිරිවැය සලකා බැලිය යුතු වැදගත් කරුණක් වන අතර, පුළුල් ඇගයීමක දී ප්‍රතිපත්තිවල ඵලදායීතාවය, ප්‍රතිලාභීන්, ආදායම් බෙදීයාමේ බලපෑම්, ආර්ථික බලපෑම්, පරිපාලන හා අනුකූලතා පිරිවැය, චර්යාත්මක ප්‍රතිචාර සහ විකල්ප ප්‍රතිපත්ති උපකරණ පැවතීම ද සැලකිල්ලට ගත යුතුය.

I වන කොටස

බදු ආදායම් අහිමිවීම සහ මූලික බදු ක්‍රමය

1 වන පරිච්ඡේදය - හැඳින්වීම

1.1 සමාලෝචනය

බදු පද්ධතිය තුළ අන්තර්ගත වන වරණීය ප්‍රතිපාදන හරහා අභිමි වන ආදායම හෙළිදරව් කිරීම මඟින් බදු ආදායම් අභිමිවීම පිළිබඳ වාර්තාකරණය රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය වැඩිදියුණු කරයි. මෙවැනි ප්‍රතිපාදන මඟින් නීත්‍යානුකූල ආර්ථික හා සමාජයීය අරමුණු ළඟා කර ගත හැකි වුවද, සෘජු වියදම් ලෙස සාමාන්‍යයෙන් අයවැය තුළ පිළිබිඹු නොවන අතර, බදු ආදායම් අඩු වීම් ලෙස පිළිබිඹු වේ.

බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය 2025/2026 මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු උපකරණ යටතේ ඇති වන ප්‍රධාන බදු ආදායම් අභිමිවීම් පිළිබඳ ඒකාබද්ධ ඇගයීමක් ඉදිරිපත් කරයි. බදු ක්‍රමය හරහා ලබා දෙන රාජ්‍ය අනුග්‍රහයෙහි ස්වභාවය, රාජ්‍ය මූල්‍ය පිරිවැය, ප්‍රතිපත්තිමය තාර්කිකත්වය සහ ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සැපයීම මඟින් එය අයවැය ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලබයි.

මෙම ප්‍රකාශය, 2024/2025 ප්‍රකාශය තුළ ස්ථාපිත කරන ලද ක්‍රමවේදය මත පදනම් වන අතර පහත දැක්වෙන ආකාරයට එය තවදුරටත් විකාශනය කරනු ලබයි:

- සෑම ප්‍රධාන බද්දක් සඳහාම පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද මූලික මිණුමක් අදාළ කිරීම;
- ව්‍යුහාත්මක ලක්ෂණ, ප්‍රතිපත්තිමය හේතු මත ඇති කෙරෙන බදු ආදායම් අභිමිවීම්වලින් වෙන් කොට හඳුනා ගැනීම;
- බදු ආදායම් අභිමිවීම් ස්වරූපය මෙන්ම ප්‍රතිපත්තිමය තාර්කිකත්වය යන ද්විත්වය අනුවම වර්ගීකරණය කිරීම;
- ඇස්තමේන්තු කිරීමේ සහ වාර්තා කිරීමේ අනුකූලතාව වැඩිදියුණු කිරීම;
- දත්ත සීමාවන් සහ ක්‍රමවේදයට අදාළ උපකල්පන හඳුනා ගැනීම; සහ
- අනාගත ඇගයීම් සඳහා පදනමක් ලෙස බදු ආදායම් අභිමිවීම පිළිබඳ ලේඛනය ශක්තිමත් කිරීම.

මෙම ප්‍රකාශනය මඟින් සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, නිෂ්පාදන බද්ද, රේගු ආනයන බද්ද සහ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද යන බදු ආවරණය කරනු ලබයි. යම් ප්‍රතිපාදනයක් විභව බදු ආදායම් අභිමිවීමක් ලෙස හඳුනාගත හැකි වුවද, එය නිවැරදි ලෙස ගණනය කිරීමට නොහැකි අවස්ථාවල දී, ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම වෙනුවට එය වෙන්ව අනාවරණය කරනු ලැබේ.

එබැවින්, මෙහි අරමුණ වන්නේ හුදෙක් සමස්ත අභිමි වූ බදු ආදායම් අගයක් ලබා දීම නොව, බදු ප්‍රතිපත්තිමය තීරණයන්හි රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵලයන් තේරුම් ගැනීම උදෙසා විනිවිදභාවයෙන් යුත්, අනුකූල මෙන්ම විශ්ලේෂණාත්මකව ප්‍රයෝජනවත් රාමුවක් ස්ථාපිත කිරීමයි.

1.2 අරමුණු සහ විෂය පථය

බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20(2)(ඌ) වන වගන්තියට අනුකූලව සම්පාදනය කර ඇත.

මෙම ප්‍රකාශයේ ප්‍රධාන අරමුණු වන්නේ:

1. බදු පද්ධතිය හරහා රාජ්‍ය සම්පත් භාවිතය පිළිබඳ විනිවිදභාවය වර්ධනය කිරීම;
2. බදු ආදායම් අභිමිවීම් හඳුනා ගැනීම සහ ප්‍රායෝගික අවස්ථාවල දී ඒවා ගණනය කිරීම;
3. වරණීය ප්‍රතිපාදන ඇගයීමට ලක්කළ හැකි ස්ථාවර මූලික මිණුමක් ස්ථාපිත කිරීම;
4. සැලකිය යුතු බදු ආදායම් අභිමිවීම්වල නෛතික පදනම, ස්වරූපය සහ ප්‍රතිපත්තිමය තාර්කිකත්වය අනාවරණය කිරීම;
5. වාර්ෂික අයවැය සහ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ බදු ප්‍රතිපත්ති නිරීක්ෂණය සඳහා සහාය වීම; සහ
6. බදු ආදායම් අභිමිවීම් වරින් වර ඇගයීම, පවත්වාගෙන යාම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම සඳහා සාක්ෂි මත වූ පදනමක් සපයා දීමයි.

මෙහි විෂය පථය ද්‍රව්‍යමය බව, ප්‍රතිපත්තිමය අදාළත්වය, දත්ත සුලබතාව සහ නිවැරදි ඇස්තමේන්තුවල ශක්‍යතාව යන කරුණු මත නිර්ණය කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, යම් නිශ්චිත ප්‍රතිපාදනයක් ප්‍රමාණනය කිරීමට අපොහොසත් වීම යන්නෙන් අදාළ බදු ආදායම් අභිමිවීම නොපවතින බවක් අනිවාර්යයෙන්ම ගම්‍ය නොවේ.

1.3 බදු ආදායම් අභිමිවීම අර්ථ දැක්වීම සහ වර්ගීකරණය

බදු ආදායම් අභිමිවීමක් යනු අදාළ මූලික බදු ක්‍රමය යටතේ අදාළ වන සැලකීමට සාපේක්ෂව, නිශ්චිත බදු ගෙවන්නෙකු, ක්‍රියාකාරකමක්, ගනුදෙනුවක්, අංශයක්, ආදායම් මාර්ගයක්, භාණ්ඩ හෝ සේවා සඳහා වරණීය සැලකිල්ලක් ලබා දෙන බදු පද්ධතියේ ප්‍රතිපාදනයකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආදායම අභිමි වීමක් හෝ ප්‍රමාද වීමක් සිදු වේ.

එබැවින්, මෙම සංකල්පය ස්වභාවයෙන්ම මූලික මිණුම් මත පදනම් වන්නකි. යම් ප්‍රතිපාදනයක්, ගෙවිය යුතු බද්ද අඩු කිරීම නිසාම බදු ආදායම් අභිමිවීමක් ලෙස නොසැලකේ. එය අදාළ මූලික මිණුම් යටතේ ස්ථාපිත සම්මත සැලකිල්ලෙන් බැහැරවීමක් නිරූපණය කළ යුතු වේ.

බදු ආදායම් අභිමිවීම් විවිධ ස්වරූපයන් ගත හැක.

වගුව **1.1 :** බදු වර්ගය අනුව පොදු බදු ආදායම අභිමිවීම් සඳහා උදාහරණ

බදු වර්ගය	උදාහරණ
පුද්ගල ආදායම් බද්ද	ආදායම් නිදහස් කිරීම්; අඩුකිරීම් සහ දීමනා; සුදුසුකම් ලබන සහන; නිශ්චිත ආදායම් සඳහා වන වරණීය බදු අනුපාත; ඉලක්කගත සහන
සංස්ථාපිත ආදායම් බද්ද	බදු විරාම; වරණීය බදු අනුපාත; ආයෝජන සහන; වර්ධිත ප්‍රාග්ධන දීමනා; වර්ධිත අඩුකිරීම්; නිදහස් කිරීම් සහ විශේෂ ආයෝජන පාලන ක්‍රමවේද
එකතු කළ අගය මත බද්ද	නිදහස් කිරීම්; වරණීය බදු අනුපාත; ව්‍යාපෘති - විශේෂිත සහන; නිශ්චිත භාණ්ඩ, සේවා හෝ ක්‍රියාකාරකම්හි ඉලක්කගත බදු සහන
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	නිශ්චිත භාණ්ඩ, සේවා හෝ ක්‍රියාකාරකම්හි නිදහස් කිරීම්; ව්‍යාපෘති - විශේෂිත සහන; බද්දට යටත් පිරිවැටුම් පදනමෙන් බැහැර කිරීම්
නිෂ්පාදන බද්ද	නිදහස් කිරීම්; වරණීය බදු අනුපාත; නිෂ්පාදන - විශේෂිත සහන; නිශ්චිත භාවිතයන් හෝ ක්‍රියාකාරකම් සඳහා වන සහන
රේගු ආනයන බද්ද	ආනයන බදු නිදහස් කිරීම්; වරණීය බදු අනුපාත; ආයෝජන ආශ්‍රිත සහන; ව්‍යාපෘති-විශේෂිත සහන; නිශ්චිත යන්ත්‍රසූත්‍ර, උපකරණ හෝ ආදාන මත වන සහන
මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද	නිශ්චිත කාණ්ඩවල මෝටර් රථ සඳහා වන නිදහස් කිරීම් හෝ ඒවා සඳහා වන වරණීය බදු අනුපාත

වගුව **1.2 :** බදු ආදායම් අභිමිවීම වර්ගීකරණය

බදු ආදායම් අභිමිවීමේ ආකාරය	විස්තරය
බදු නිදහස් කිරීම	නිශ්චිත ආදායම්, භාණ්ඩ, සේවා, ගනුදෙනු, ක්‍රියාකාරකම් හෝ බදු ගෙවන්නන් බදු පදනමෙන් බැහැර කෙරේ.
වරණීය බදු අනුපාතය	නිශ්චිත බදු ගෙවන්නන්, ආදායම්, භාණ්ඩ, සේවා හෝ ක්‍රියාකාරකම් සඳහා මූලික මිණුම් අනුපාතයට වඩා අඩු අනුපාතයක් අදාළ කෙරේ.
බදු විරාම	නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා පූර්ණ හෝ පාර්ශ්වික බදු නිදහස් කිරීමක් සපයනු ලැබේ.
විශේෂ පාලන ක්‍රමවේදය	නිශ්චිත ක්ෂේත්‍රයක්, ව්‍යාපෘතියක්, භූගෝලීය කලාපයක් හෝ බදු ගෙවන්නන්ගේ කණ්ඩායමක් සඳහා වෙන්වූ බදු සැලකිල්ලක් ලබා දේ.
ආයෝජන / ප්‍රාග්ධන අයකර ගැනීමේ දිරිගැන්වීම	මූලික මිණුම් යටතේ වේගවත්ව හෝ වඩාත් ත්‍යාගශීලීව ආයෝජන වියදම් පියවා ගැනීමට ඉඩ සලසා දේ.
වැඩිදියුණු කළ අඩු කිරීම් / දීමනා	මූලික මිණුම් යටතේ සාමාන්‍යයෙන් පවතින ප්‍රමාණය ඉක්මවන අඩු කිරීම් සඳහා ඉඩ සලසා දේ .
බදු බැර	වෙනත් ආකාරයකින් ගෙවිය යුතු බදු මුදල නිශ්චිත ප්‍රමාණයකින් අඩු කරනු ලැබේ.
බදු වට්ටම් / ආපසු ගෙවීම	නිශ්චිත කොන්දේසි යටතේ ගෙවන ලද බදු මුදල ආපසු ලබා දීම හෝ බදු වගකීම අඩු කිරීම සිදු කෙරේ.
බදු කල්දැමීම	බදු ගෙවීමේ කාලය හෝ බද්දට යටත් ආදායම හඳුනා ගැනීමේ කාලසීමාව පමා කරනු ලැබේ.
තක්සේරු කිරීමේ සහන	වරණීය තක්සේරු කිරීමේ රීතියක් හෝ අගයක් භාවිත කරමින් බද්දට යටත් අගය නිර්ණය කරනු ලැබේ.
සීමා / බැහැර කිරීම්	මූලික මිණුම්වලින් බැහැර වන බදු සැලකිල්ලට යටත්වන නිර්වචනය කළ සීමාවක් තුළ හෝ එම සීමාවට පහළ, නිශ්චිත බදු ගෙවන්නන් හෝ ක්‍රියාකාරකම් බද්දෙන්
විශේෂිත ආංශික / ස්ථානීය සහන	නිශ්චිත කර්මාන්ත, ක්‍රියාකාරකම් හෝ භූගෝලීය ප්‍රදේශ සඳහා වරණීය සැලකිල්ලක් සපයනු ලැබේ.

බදු ආදායම් අභිමිවීම පිළිබඳ තාර්කිකත්වය

බදු ආදායම අභිමිවීමක ස්වරූපය මඟින් අදාළ වරණීය සැලකිල්ල සපයනු ලබන ආකාරය විස්තර කෙරෙන අතර, එහි තාර්කිකත්වය මඟින් එම ක්‍රියාමාර්ග හඳුන්වා දීමට මුල් වූ හේතු සාධක පැහැදිලි කෙරේ.

වගුව 1.3 : බදු ආදායම් අභිමිවීම සඳහා වන ප්‍රධාන ප්‍රතිපත්තිමය තාර්කිකත්වයන්

ප්‍රතිපත්තිමය තාර්කිකත්වය	ප්‍රධාන අරමුණ
ආයෝජන ප්‍රවර්ධනය	ආයෝජනය සඳහා වන බදු පසු පිරිවැය අඩු කර, ආයෝජන ආකර්ෂණය කර ගැනීම හෝ පුළුල් කිරීම.
ආර්ථික වර්ධනය සහ නිෂ්පාදන ධාරිතාව	ප්‍රාග්ධන සැකැස්ම, නිෂ්පාදනය සහ ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීම ප්‍රවර්ධනය කිරීම.
රැකියා උත්පාදනය	රැකියා නිර්මාණය කරන හෝ පවත්වාගෙන යන ක්‍රියාකාරකම් දිරිගැන්වීම.
අපනයන ප්‍රවර්ධනය	අපනයන - නැඹුරු ක්‍රියාකාරකම්වල තරඟකාරීත්වය වර්ධනය කිරීම.
ආංශික සංවර්ධනය	ආර්ථිකමය හෝ උපායමාර්ගික වශයෙන් වැදගත් යැයි සැලකෙන අංශ වෙත සහාය වීම.
ප්‍රාදේශීය සංවර්ධනය	නිශ්චිත ප්‍රදේශවල ආයෝජන සහ ආර්ථික ක්‍රියාකාරකම් දිරිගැන්වීම.
සමාජ ආරක්ෂණය	ඉලක්කගත සහන අවශ්‍ය වන පුද්ගලයන් හෝ කණ්ඩායම් මත වන බදු බර අවම කිරීම.
අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා දැරිය හැකි මිලකට පැවතීම	අත්‍යවශ්‍ය හෝ සමාජයීය වශයෙන් වැදගත් යැයි සැලකෙන භාණ්ඩ සහ සේවා මත පනවන බදු අඩු කිරීම.
පර්යේෂණ, නවෝත්පාදන සහ තාක්ෂණය	පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන සහ ඵලදායීතා වැඩිදියුණු කිරීම, දිරිගැන්වීම
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් පිහිටුවීම, විධිමත් කිරීම සහ පුළුල් කිරීම සඳහා සහාය වීම.
කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනය	කෘෂිකර්මාන්තය, ආහාර සුරක්ෂිතතාව සහ ග්‍රාමීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.
පාරිසරික අරමුණු	පාරිසරික වශයෙන් තිරසර ආයෝජන සහ පිරිසිදු තාක්ෂණයන් දිරිගැන්වීම.
ජාත්‍යන්තර තරඟකාරීත්වය	ජාත්‍යන්තර තරඟකාරී ව්‍යාපාර විසින් මුහුණ දෙන බදු ආශ්‍රිත අවාසිදායක තත්ත්වයන් සඳහා විසඳුම් ලබා දීම.
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති	දේශීය ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් යැයි සැලකෙන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම.
පරිපාලන සරලකරණය	සමානුපාතික නොවන අනුකූලතා සහ පරිපාලන වියදම් අවම කිරීම.
ජාත්‍යන්තර වගකීම්	ගිවිසුම්ගත, වෙළඳ සහ අනෙකුත් ජාත්‍යන්තර කැපවීම් බලාත්මක කිරීම.
ද්විත්ව බදු / බදු මත බදු අයවීම් වැළැක්වීම	අපේක්ෂා නොකළ බදු අයවීම් වැළැක්වීම සහ බදු පද්ධතියේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.

එකම වර්ගයේ බදු ආදායම් අභිමිවීමක්ම, විවිධ අරමුණු ළඟා කර ගැනීම සඳහා බලපෑ හැකි අතර, එම ප්‍රතිපත්තිමය අරමුණු විවිධ බදු උපකරණ හරහා ද ක්‍රියාත්මක විය හැක.

ඒ අනුව, බදු ආදායම් අභිමිවීම පිළිබඳ ලේඛනය 2025/2026 මඟින් බදු ආදායම් අභිමිවීමේ යාන්ත්‍රණය මෙන්ම ඊට හේතු වූ ප්‍රතිපත්තිමය තාර්කිකත්වය යන කරුණු ද්විත්වය හඳුනා ගනු ලබයි.

1.4 මූලික බදු ක්‍රමය

මූලික බදු ක්‍රමය මඟින් බදු ආදායම් අභිමිවීම හඳුනාගැනීම සහ මිනුම් කිරීම සඳහා වන මූලාශ්‍රය සපයනු ලැබේ. එය අදාළ බදු නීති යටතේ පොදුවේ අදාළ වන බදු සැලකිල්ල පිළිබිඹු කරන අතර, නිශ්චිත නිදහස් කිරීම්, අඩු කිරීම්, වරණීය බදු අනුපාත, බදු විරාම, දීමනා, බදු බැර, බදු ගෙවීම කල් දැමීම් සහ වෙනත් සහන තක්සේරු කරනු ලබන්නේ මෙම පදනම මත වේ.

මෙම මූලික මිණුම්, ආදායම් බදු, පරිභෝජන බදු, නිෂ්පාදන බදු සහ රේගු බදුවල පවතින විවිධ නීතිමය හා ව්‍යුහාත්මක ලක්ෂණ නිරූපණය කරමින් අනිවාර්යයෙන්ම අදාළ බදු වර්ගයට විශේෂිත වේ. ඒ අනුව, එක් එක් බදු සඳහා වන මූලික මිණුම් තීරණය කරනු ලබන්නේ අදාළ බදුකරණ ඒකකය, වාසික හෝ භෞමික පදනම, බදු අයවන කාල සීමාව, බදු පදනම, අනුපාත ව්‍යුහය, ලියාපදිංචි වීමේ සීමාව සහ බදු ක්‍රමයේ අනෙකුත් මූලික ලක්ෂණ අදාළ කරගනිමිනි.

බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය 2024/2025 හි අනුගමනය කරන ලද ක්‍රමවේදයට අනුකූලව, 2025/2026 ප්‍රකාශය ද යොමුගත නීතිමය ප්‍රවේශයක් (reference-law approach) අනුගමනය කරනු ලැබේ. මෙම ප්‍රවේශය යටතේ, අදාළ බදු පද්ධතිය ආර්ථික හෝ ප්‍රතිපත්තිමය දෘෂ්ටිකෝණයකින් කෙසේ විය යුතුද යන්න පිළිබඳ තක්සේරුවකට වඩා, එම බද්දට අදාළ සාමාන්‍ය ව්‍යවස්ථාපිත ව්‍යුහය පදනම් කරගනිමින් මූලික බදු ක්‍රමය නිර්ණය කරනු ලැබේ.

එබැවින්, මෙම මූලික මිණුම් මඟින් අදාළ බදු ක්‍රමයේ මූලික හෝ ව්‍යුහාත්මක අංග ලෙස සලකනු ලබන ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. සාමාන්‍ය බදු පදනම, සාමාන්‍ය බදු අනුපාත, අනුක්‍රමික අනුපාත ක්‍රම, සීමාවන්, සාමාන්‍ය අඩු කිරීම් සහ දීමනා, බදු බැර ආදාන සහ බදු ක්‍රමයේ නිසි ක්‍රියාකාරීත්වයට අවශ්‍ය අනෙකුත් නීති මීට ඇතුළත් වේ.

අදාළ මූලික මිණුම්වලට සාපේක්ෂව වරණීය සැලකිල්ලක් සපයන අවස්ථාවක දී යම් බදු ප්‍රතිපාදනයක් බදු ආදායම් අභිමිවීමක් ලෙස හඳුනාගනු ලැබේ. යම් බදු ප්‍රතිපාදනයක් මඟින් ගෙවිය යුතු බදු ප්‍රමාණය අඩු වන පමණින්ම, එය බදු ආදායම් අභිමිවීමක් ලෙස සැලකිය නොහැකි වේ. බදු නීති මඟින් විවිධ බදු ගෙවන්නන්, ක්‍රියාකාරකම්, නිෂ්පාදන හෝ ආදායම් කාණ්ඩ සඳහා විවිධ අනුපාත, සීමාවන් හෝ සැලකීම් සපයන අවස්ථාවල දී මෙම වෙනස විශේෂයෙන් අදාළ වේ. එවැනි වෙනස්කම් බදු ආදායම් අභිමිවීම් ලෙස සලකනු ලබන්නේ ඒවා පවත්නා බදු ව්‍යුහයෙන් සිදුවන ප්‍රතිපත්තිමය අපගමනයන් වන විට පමණක් වේ.

මෙම මූලික මිණුම් යනු ක්‍රමවේදමය යොමුවක් පමණක් වන අතර, එය ප්‍රශස්ත බදු ප්‍රතිපත්තිය නියෝජනය කරන්නේය යන සම්මතමය විනිශ්චයක් නොවේ.

2025/2026 ප්‍රකාශය සඳහා භාවිතා කරන ලද මූලික බදු ක්‍රමය පහත දැක්වේ.

වගුව 1.4 : මූලික බදු ක්‍රමයේ පරාමිතීන් පිළිබඳ සැකෙවින්

බදු වර්ගය	බදුකරණ ඒකකය	මූලික බදු අනුපාතය
සංස්ථාපිත ආදායම් බද්ද	සමාගම හෝ වෙනත් බදු ගෙවිය යුතු ආයතන	සියයට 30ක සම්මත අනුපාතය
පුද්ගල ආදායම් බද්ද	තනි පුද්ගල බදු ගෙවන්නන්	අනුක්‍රමික ව්‍යුහය, සියයට 6 සිට 36 දක්වා
එකතු කළ අගය මත බද්ද	බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හා ආනයන	සියයට 18ක සම්මත අනුපාතය
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	බද්දට යටත් පිරිවැටුම	බද්දට යටත් පිරිවැටුමෙන් සියයට 2.5
නිෂ්පාදන බද්ද	නිශ්චිත නිෂ්පාදන බදු අය කළ හැකි භාණ්ඩ	එක් එක් නිෂ්පාදන සඳහා වන ව්‍යවස්ථාපිත අනුපාතය
රේගු ආනයන බද්ද	ආනයනික ගනුදෙනුව සහ භාණ්ඩය (සංයෝජිත වර්ගීකරණයට අනුව)	සංයෝජිත වර්ගීකරණය අනුව සාමාන්‍ය තීරු බදු අනුපාතය
මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද	ව්‍යුහාත්මක විෂය පථය තුළ ඇති මෝටර් රථ	වාහන වර්ගය අනුව නිශ්චිත ගාස්තු සහ සීමා

1.4.1 සංස්ථාපිත ආදායම් බද්ද

බදුකරණ ඒකකය

මූලික බදුකරණ ඒකකය වන්නේ සංස්ථාපිත ආදායම් බද්දට යටත් වන සමාගම හෝ වෙනත් බදු ගෙවිය යුතු ආයතන වේ.

නේවාසික

ශ්‍රී ලංකාව තුළ උපයන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන ආදායම් බදුකරණය පාලනය කරනු ලබන නීති ඇතුළත්ව වාසික සහ නිර්වාසික ආයතන අතර ඇති ව්‍යවස්ථාපිත වෙනස්කම් මෙහි දී සලකනු ලැබේ.

තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වන්නේ:

අ) එය ශ්‍රී ලංකාවේ නීති යටතේ සංස්ථාපනය කර හෝ පිහිටුවා ඇත්නම්;

ආ) එහි ලියාපදිංචි කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත්නම්; හෝ

ඇ) එම වර්ෂය තුළ ඕනෑම අවස්ථාවක එහි කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබුවහොත් වේ.

බදු අයවන කාල සීමාව

තක්සේරු වර්ෂය මූලික බදුකරණ කාලසීමාව ලෙස සලකනු ලබන අතර, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට යටත්ව, එය සාමාන්‍යයෙන් අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වී පසු වර්ෂයේ මාර්තු 31 වන දිනෙන් අවසන් වේ.

බදු පදනම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුව තීරණය කරනු ලබන සමාගමේ බදු අය කළ හැකි ආදායම බදු පදනමේ මූලික මිනුම වේ. වාසික සමාගම් ඒවායේ ගෝලීය ආදායම මත බද්දට යටත් වේ. ඇතැම් ආදායම් වර්ග සඳහා බදු නිදහස් කිරීම් ලබා දෙනු ලැබේ. අදාළ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට යටත්ව, අනේවාසික සමාගම් සඳහා ශ්‍රී ලංකාව තුළ උපයන හෝ උපචිත වන ආදායම මත බදු අය කරනු ලැබේ.

විශේෂ සටහන්:

- රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සංස්ථාපිත ආදායම් බද්දට යටත් නොවේ. මෙය මූලික බදු ක්‍රමයේ කොටසක් ලෙස සැලකේ.
- ද්විත්ව බදුකරණයෙන් සහන ලබා දීමේ ක්‍රමවේදයන් මූලික ආදායම් බදු ක්‍රමයේ කොටසක් ලෙස සැලකේ.

බදු අනුපාතය

සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව, ගිණුම්කරණ ලාභය සඳහා වන මූලික ක්ෂය අනුපාත ඇතුළු ගැලපීම් සිදු කිරීමෙන් පසු බදු අය කළ හැකි ආදායම සඳහා සියයට 30 ක මූලික සංස්ථාපිත ආදායම් බදු අනුපාතය අදාළ වේ.

බදු ක්‍රමය මඟින් ඇතැම් ක්‍රියාකාරකම් හෝ ආදායම් කාණ්ඩ සඳහා නිශ්චිත ව්‍යවස්ථාපිත බදු අනුපාත ද සපයනු ලැබේ. මූලික බදු තීරණය කිරීමේ දී එවැනි අනුපාත වෙනම හඳුනාගනු ලබන අතර, ඒවා මූලික බදු අනුපාතයෙන් වෙනස් වන පමණින්ම බදු ආදායම් අහිමිවීමක් ලෙස සලකනු නොලැබේ.

1.4.2 පුද්ගල ආදායම් බද්ද

බදුකරණ ඒකකය

මූලික බදුකරණ ඒකකය වන්නේ තනි පුද්ගල බදු ගෙවන්නන් වේ.

නේවාසික

මෙම මූලික මිණුම්, ව්‍යවස්ථාපිත නේවාසික සහ මූලාශ්‍ර නීතිවලට අනුකූලව වාසික සහ නිර්වාසික පුද්ගලයින් අතර වෙනස හඳුනා ගනී. එබැවින්, ආදායමේ අදාළ සැලකීම තීරණය වන්නේ ආදායමේ ස්වභාවය සහ මූලාශ්‍රය සහ බදු ගෙවන්නාගේ නේවාසික තත්ත්වය අනුව ය. තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයෙක් ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වන්නේ එම පුද්ගලයා:

අ) ශ්‍රී ලංකාවේ වාසය කරන්නේ නම්;

ආ) එම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව තුළ කායික වශයෙන් සිටී නම් සහ එම කාලසීමාවේ මුළු එකතුව එම වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාල සීමාවක් තුළ දී දින 183ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්;

ඇ) ශ්‍රී ලංකා රජයේ සේවකයෙකු හෝ නිළධාරියෙකු වේ නම් සහ එම පුද්ගලයාගේ කලත්‍රයා විදේශයක ඇත්නම්; හෝ

ඈ) වෙළෙඳ නැව් පනත යටතේ අර්ථ නිරූපණය කරන ලද ශ්‍රී ලංකා නෞකාවක සේවයේ නියුතු අයෙකු නම් වේ.

බදු අයවන කාල සීමාව

තක්සේරු වර්ෂය මූලික බදුකරණ කාලසීමාව ලෙස සලකනු ලබන අතර, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට යටත්ව, එය සාමාන්‍යයෙන් අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වී පසු වර්ෂයේ මාර්තු 31 වන දිනෙන් අවසන් වේ.

බදු පදනම

මූලික බදු පදනම යනු පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායමයි. වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන විට, එම වර්ෂය සඳහා කොතැනක හෝ ඇති වන ඔහුගේ සේවා නියුක්ති, ව්‍යාපාර, ආයෝජන හෝ වෙනත් මූලාශ්‍රයකින් ලැබෙන ආදායම සහ නිර්වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් වන තාක් දුරට සේවා නියුක්ති, ව්‍යාපාර, ආයෝජන හෝ වෙනත් මූලාශ්‍රයකින් උපචිත වන ඔහුගේ ආදායම වේ. වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් ලෝක ව්‍යාප්ත ආදායම සහ නිර්වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ මූලාශ්‍රය පිහිටා ඇති ආදායම බදු පදනම වේ.

බදු අනුපාතය

2025 අප්‍රේල් 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන තක්සේරු වර්ෂ සඳහා, සුදුසුකම්ලත් වාසික පුද්ගලයන් සහ නිර්වාසික පුරවැසියන් සඳහා අදාළ වන අනුක්‍රමික අනුපාත ව්‍යුහය පහත පරිදි වේ.

වගුව 1.5 : පුද්ගල ආදායම් බදු : මූලික අනුක්‍රමික බදු අනුපාත ව්‍යුහය

ස්ථරය	බදු අය කළ හැකි ආදායම	ආන්තික බදු අනුපාතය	ස්ථරය සඳහා උපරිම බද්ද (රු.)	සමුච්චිත බද්ද (රු.)
1	රු. මිලියන 1.8 - රු. මිලියන 2.8	6%	60,000	60,000
2	රු. මිලියන 2.8 - රු. මිලියන 3.3	18%	90,000	150,000
3	රු. මිලියන 3.3 - රු. මිලියන 3.8	24%	120,000	270,000
4	රු. මිලියන 3.8 - රු. මිලියන 4.3	30%	150,000	420,000
5	රු. මිලියන 4.3 ට වැඩි	36%	-	-

සටහන: 2025 අප්‍රේල් 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂ සඳහා, සුදුසුකම් ලත් වාසික පුද්ගලයින්ට සහ අනේවාසික පුරවැසියන්ට මෙම බදු අනුපාත අදාළ වේ. එක් එක් පරාස සඳහා වන බදු සහ සමුච්චිත බදු, මෙහි දක්වා ඇති ව්‍යවස්ථාපිත බදු අනුපාත මත පදනම්ව ගණනය කර ඇත.

එබැවින්, එක් මූලික බදු අනුපාතයක් පමණක් යොදා ගැනීම වෙනුවට, අනුක්‍රමික බදු ව්‍යුහය සම්මත බදු ක්‍රමයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකනු ලැබේ.

ව්‍යුහාත්මක සහන

2025 අප්‍රේල් 01 දින සිට අදාළ වන පරිදි, සුදුසුකම් ලබන බදු ගෙවන්නන් සඳහා ලබා දී ඇත. තක්සේරු වර්ෂයකට රුපියල් මිලියන 1.8ක පුද්ගලික සහනය, පුද්ගල ආදායම් බදු ක්‍රමයේ සාමාන්‍ය ව්‍යුහයේ අංගයක් ඇති කරන බැවින්, එය මූලික බදු ක්‍රමයට ඇතුළත් කරනු ලැබේ.

විශේෂ සටහන්

- භාණ්ඩාගාර බැඳුම්කර/බිල්පත් හෝ අරමුදලක ආයෝජන අවස්ථාවේ දී බදුකරණයට ලක් නොවී, ප්‍රතිලාභියා වෙත ආදායම ගලා යාමට ඇති හැකියාව මූලික ආදායම් බදු ක්‍රමයේ කොටසක් ලෙස සැලකේ.

1.4.3 එකතු කළ අගය මත බද්ද

බදුකරණ ඒකකය

මූලික බදුකරණ ඒකකය වන්නේ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හා ආනයන වේ.

බදු අයවන කාල සීමාව

මාසයක කාල සීමාව හෝ සෑම වසරකම පිළිවෙළින් ජනවාරි පළමුවන දිනෙන්, අප්‍රේල් පළමුවන දිනෙන්, ජූලි පළමුවන දිනෙන් සහ ඔක්තෝම්බර් පළමුවන දිනෙන් ආරම්භ වන මාස තුනක කාල සීමාවන් වේ.

බදු පදනම

ව්‍යුහාත්මක තක්සේරු ප්‍රතිපාදනවලට අනුව සහ සාමාන්‍ය ආදාන බදු බැර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමෙන් පසු තීරණය වන බදු අය කළ හැකි භාණ්ඩ හා සේවාවන්හි වටිනාකමයි.

බදු අනුපාතය

සියයට 18ක මූලික අනුපාතය ප්‍රධාන මිනුම් අනුපාතය ලෙස සැලකේ.

ලියාපදිංචි වීමේ සීමාව

කාර්තුවකට රු. මිලියන 15 ක් හෝ වර්ෂයකට රු. මිලියන 60 ක් ඉක්මවන බදු අය කළ හැකි සැපයුම් හෝ ආනයන.

1.4.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

බදුකරණ ඒකකය

මූලික බදුකරණ ඒකකය වන්නේ බද්දට යටත් පිරිවැටුම වේ.

බදු අයවන කාල සීමාව

නියමිත බදු කාලසීමාව සඳහා බද්ද තීරණය කරනු ලැබේ. බද්දට යටත් කාර්තුව වන්නේ ජනවාරි 01වන දින සිට දෙසැම්බර් 31වන දින දක්වා ලිත් වර්ෂයක සෑම කාර්තුවක් වේ.

බදු පදනම

මූලික බදු පදනම ලෙස සැලකෙන්නේ දළ පිරිවැටුම නොව බද්දට යටත් පිරිවැටුම වේ. සිදු කරනු ලබන ක්‍රියාකාරකමේ ස්වභාවය අනුව, පිරිවැටුමෙන් කුමන අනුපාතයක් බද්දට යටත් පිරිවැටුම ලෙස සැලකිය යුතු ද යන්න නීතිය මඟින් නියම කර ඇත.

පහත සඳහන් ඕනෑම බදු අය කළ හැකි පුද්ගලයෙකු ඇතුළත් වේ:

අ) යම් ද්‍රව්‍යයක් ආනයනය කරන්නන්;

ආ) යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරවල නිරත වන්නන්;

ඇ) ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් කරනු ලබන තැනැත්තන්;

ඈ) යම් ද්‍රව්‍යයක් ආනයනය කර විකිණීම ඇතුළුව, එවැනි ද්‍රව්‍යයක තොග හෝ සිල්ලර ව්‍යාපාරවල නිරත වන්නන්.

බදු අනුපාතය

මූලික බදු අනුපාතය බද්දට යටත් පිරිවැටුමෙන් සියයට 2.5% ක් වේ.

ලියාපදිංචි වීමේ සීමාව

මුළු පිරිවැටුමේ එකතුව කාර්තුවකට රු. මිලියන 09 ක් හෝ මාස දොළහකට රු. මිලියන 36 ක් ඉක්මවීම වේ.

1.4.5 නිෂ්පාදන බද්ද

බදුකරණ ඒකකය

2025 ජනවාරි 10 දිනැති අංක 2418/43 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ දක්වා ඇති නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ වේ.

බදු අයවන කාල සීමාව / අවස්ථාව

සාමාන්‍යයෙන් අදාළ භාණ්ඩය නිෂ්පාදනය හෝ ආනයනය කිරීමේ දී නියමිත ව්‍යුහාත්මක බදුකරණ අවස්ථාවේ දී බද්දට යටත් වීම සිදු වේ.

බදු පදනම

වර්ෂය තුළ ආනයනය හෝ නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල මුළු ප්‍රමාණයයි.

බදු අනුපාතය

2025 ජනවාරි 10 දිනැති අංක 2418/43 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ දක්වා ඇති නිෂ්පාදන බදු අනුපාත වේ.

1.4.6 රේගු ආනයන බද්ද

බදුකරණ ඒකකය

මූලික බදුකරණ ඒකකය වන්නේ අදාළ සංයෝජිත වර්ගීකරණයට අනුව වර්ගීකරණය කරන ලද ආනයන ගනුදෙනුව සහ අදාළ ආනයනික භාණ්ඩ වේ.

බදු අයවන කාල සීමාව / අවස්ථාව

බද්දට යටත් වීම භාණ්ඩ ආනයනයේ දී ඇති වේ. වාර්තා කිරීම සඳහා මූල්‍ය වර්ෂය තුළ අගයන් එකතු කරනු ලැබේ.

බදු පදනම

රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) සහ ලෝක වෙළෙඳ සංවිධානයේ රේගු තක්සේරු ගිවිසුම අනුව තීරණය කරනු ලබන ආනයනික භාණ්ඩවල පිරිවැය, රක්ෂණ හා ගැල් කුළී වටිනාකමයි.

බදු අනුපාතය

විශේෂිත යෝජනා ක්‍රම හෝ ගිවිසුම් යටතේ (උදා: ආයෝජන මණ්ඩල සහන, නිදහස් වෙළෙඳ ගිවිසුම්, විශේෂිත ව්‍යාපෘති සඳහා වන නිදහස් කිරීම්) ප්‍රදානය කරනු ලබන වරණීය හෝ සහනදායී අනුපාත හැර, කිසිදු වෙනස්කම් කිරීමකින් තොරව වඩාත් ප්‍රිය කරන ජාතිය (Most Favoured Nation) පදනම මත සියලුම ආනයන සඳහා අදාළ වන පරිදි රේගු ආනයන බදු උපලේඛනයේ ඇතුළත් ව්‍යවස්ථාපිත රේගු ආනයන බදු අනුපාත වේ.

එබැවින්, මෙම මිණුම් සමස්ත ආර්ථිකයටම පොදු වූ එකම අනුපාතයකින් නියෝජනය නොවේ. බදු ව්‍යුහයේ බහුලව යෙදෙන අනුපාත අඩංගු විය හැකි වුවද, අදාළ බදු අනුපාතය භාණ්ඩය සහ තීරුබදු වර්ගීකරණය අනුව වෙනස් වේ.

1.4.7 මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද

බදුකරණ ඒකකය

මූලික බදුකරණ ඒකකය වන්නේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්දේ ව්‍යුහාත්මක විෂය පථයට යටත් වන මෝටර් රථ වේ.

බදු අයවන කාල සීමාව / අවස්ථාව

ශ්‍රී ලංකා රේගුවෙන් මෝටර් රථය නිදහස් කර ගන්නා අවස්ථාවේ දී වේ.

බදු පදනම

ආනයනය කරන ලද හෝ දේශීයව එකලස් කරන ලද මෝටර් රථ වේ.

බදු අනුපාතය

2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/72 දරන ගැසට් නිවේදනය මඟින් නිශ්චිතව දක්වා ඇති, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/41 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් අවසන්වරට සංශෝධනය කරන ලද මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු අනුපාත වේ.

මිණුම් සළකුණු කිරීමේ ප්‍රවේශය

2025/2026 ප්‍රකාශය සඳහා, අදාළ බදු ගෙවන්නාට, ආදායමට, සැපයුමට, ගනුදෙනුවට, භාණ්ඩයට හෝ නිෂ්පාදනයට අදාළ සාමාන්‍ය ව්‍යවස්ථාපිත සැලකිල්ල යොමු කරගනිමින් එක් එක් බදු සඳහා මූලික මිණුම් ස්ථාපිත කෙරේ. මෙම ප්‍රවේශය බදු ආදායම් අහිමිවීම් හඳුනා ගැනීම සඳහා භාවිතා කරන නෛතික සහ ව්‍යුහාත්මක පරාමිතීන් පිළිබඳ වඩාත් පැහැදිලි විස්තරයක් සපයන අතර, 2024/2025 ක්‍රමවේදයේ හරය සහ අඛණ්ඩතාව ද ආරක්ෂා කරනු ලැබේ.

1.5 ව්‍යුහාත්මක සහන

න්‍යායාත්මක හෝ සරල කරන ලද බදු පදනමක් හා සසඳන විට බදු ප්‍රමාණය අඩු කරන සෑම ප්‍රතිපාදනයක්ම බදු ආදායම් අහිමිවීමක් ලෙස නොසැලකේ. ඇතැම් විධිවිධාන, බදු පද්ධතියේ ව්‍යුහාත්මක ලක්ෂණ වන අතර, අදාළ බද්දේ විෂය පථය, ක්‍රියාකාරීත්වය සහ අඛණ්ඩතාව නිර්වචනය කිරීම සඳහා ඒවා අත්‍යවශ්‍ය වේ.

2025/2026 වාර්තාව සඳහා, යම් ප්‍රතිපාදනයක් සාමාන්‍ය සැකැස්මට අත්‍යවශ්‍ය වන අවස්ථාවල දී එය ව්‍යුහාත්මක සහනයක් ලෙස සලකනු ලැබේ. පහත සඳහන් අවස්ථා මෙයට ඇතුළත් වේ:

- මූලික බදු පදනම හෝ අනුපාත ව්‍යුහය ස්ථාපිත කිරීම;
- බදුකරණ ඒකකය හෝ ලියාපදිංචි වීමේ සීමාව නිර්වචනය කිරීම;
- ද්විත්ව බදුකරණය හෝ බදු මත බදු බලපෑම් (cascading) වැළැක්වීම;
- ජාත්‍යන්තර බදු හෝ වෙළෙඳ වගකීම් ක්‍රියාත්මක කිරීම;
- පරිපාලනමය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි බව තහවුරු කිරීම; හෝ
- එසේ නොමැති නම්, බද්දේ අපේක්ෂිත ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම

වගුව 1.6 : ශ්‍රී ලංකාවේ බදු ක්‍රමයේ ව්‍යුහාත්මක සහන

බදු වර්ගය	ප්‍රතිපාදනය
පුද්ගල ආදායම් බද්ද	පුද්ගල සහන සීමාවට පහළ මට්ටමේ පවතින ආදායම මත බදු අය නොකිරීම
	අනුක්‍රමික පුද්ගල ආදායම් බදු අනුපාත දැක්වෙන උපලේඛනය
පුද්ගල ආදායම් බද්ද / සංස්ථාපිත ආදායම් බද්ද	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනයේ දැක්වෙන නිදහස් කිරීම්
	ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් යටතේ එකඟ වී ඇති වරණීය බදු අනුපාත කොටස්
	හිමිකාරීත්වය දරන පුද්ගලයන්ට ලැබෙන ලාභාංශ මත තනි, අඩු බදු අනුපාතයක් අදාළ වීම
	ආයෝජන වත්කමක් මුදල් බවට පරිවර්තනය කිරීමෙන් ලැබෙන ලාභ
සංස්ථාපිත ආදායම් බද්ද	සේවක භාරකාර අරමුදල්, අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදල් සහ සේවා අවසන් කිරීමේ අරමුදල්වල බදු අය කළ හැකි ආදායම සඳහා අදාළ වන අඩු බදු අනුපාතය
	පුණ්‍යායතනවල බදු අය කළ හැකි ආදායම සඳහා අදාළ වන අඩු බදු අනුපාතය විවිධ වත්කම් සඳහා අදාළ වන බදු ක්ෂය අනුපාත
	විවිධ වත්කම් සඳහා අදාළ වන බදු ක්ෂය අනුපාත

බදු වර්ගය	ප්‍රතිපාදනය
එකතු කළ අගය මත බද්ද	බදු ලියාපදිංචිය අනිවාර්යය නොවන ආනයන හා සැපයුම් සීමාව
	විශේෂ ආර්ථික කලාපවල පිහිටි සමාගම් විසින් ප්‍රති අපනයනය සඳහා සිදු කරන ආනයන මත බද්දෙන් නිදහස් කිරීම
	රජය විසින් සපයනු ලබන සේවාවන්
	ඕනෑම තැනැත්තෙකු විසින් සපයනු ලබන අධ්‍යාපන සේවා
	පොදු ප්‍රවාහන සේවා සැපයීම
	1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ ප්‍රතිපාදන අදාළ වන දූත මණ්ඩල සහ ඒවායේ පුද්ගලයන් සඳහා ලබා දෙන භාණ්ඩ හා සේවා: එහෙත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එසේ පවතින බවට හඳුනාගනු ලබන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ හිමිකම් පවතී.
	ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකමක් හෝ වෙනත් යම් ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවන හදිසි ආපදා සහන සැලසීම පිණිස හෝ ජාතික ආර්ථිකයේ යහපත පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සඳහා විදේශීය සංවිධාන විසින් සෘජුවම අරමුදල් සපයනු ලබන භාණ්ඩ හා සේවාවන්
	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ආගමන කවුළුවට ඔබ්බෙන් පිහිටි භෝජනාගාරයක සපයන සේවා
	යම් ආයතනයක් හෝ තැනැත්තෙකු විසින් සපයනු ලබන භූමිදාන හෝ ආදාහන කටයුතු සම්බන්ධ සේවා
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	ලියාපදිංචිය සඳහා නියම කර ඇති සීමාවට වඩා අඩු පිරිවැටුම
එකතු කළ අගය මත බද්ද / සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද / රේගු ආනයන බද්ද	2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ අය කරනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත් වන ඕනෑම ආනයනික භාණ්ඩයක්
රේගු ආනයන බද්ද	ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ අඩු කරන ලද රේගු බදු අනුපාත
	ප්‍රතිඅපනයනය සඳහා බන්ධිත ගුදම්වලට ආනයනය කරන භාණ්ඩ
	අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) සහ ආයෝජක පහසුකම් සැලසීමේ / කාර්මික පහසුකම් යෝජනා ක්‍රමය (INFAC) වැඩසටහන යටතේ අපනයනය සඳහා භාණ්ඩ සැකසීමට යොදා ගන්නා ද්‍රව්‍ය ආනයනය කිරීමේ දී අදාළ බදු
රේගු ආනයන බද්ද / නිෂ්පාදන බද්ද	1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ දක්වා ඇති පරිදි, ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව රාජ්‍ය තාන්ත්‍රික සහ ජාත්‍යන්තර සංවිධාන විසින් සිදු කරනු ලබන ආනයන සඳහා වන රේගු තීරුබදු සහ නිෂ්පාදන බදු
නිෂ්පාදන බද්ද	චිකාගෝ සම්මුතිය මඟින් ආවරණය වන ගුවන් යානා ඉන්ධන මත නිෂ්පාදන බද්දෙන් නිදහස් කිරීම

1.6 බදු ආදායම් අහිමිවීම තක්සේරු කිරීම

බදු ආදායම් අහිමිවීම තක්සේරු කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රධාන ප්‍රවේශයන් තුනක් පවතී:

i. අහිමි වූ ආදායම් ප්‍රවේශය (ස්ථිතික ඇස්තමේන්තුකරණය) – බදු ගෙවන්නන්ගේ හැසිරීම නොවෙනස්ව පවතී යැයි උපකල්පනය කරමින්, බදු ආදායම අහිමිවීමට අදාළ වූ ප්‍රතිපාදනය නොතිබුණේ නම් රජයට ලැබීමට තිබූ ආදායම් ප්‍රමාණය මෙයින් තක්සේරු කෙරේ.

ii. ආදායම් ලාභ ප්‍රවේශය (ගතික ඇස්තමේන්තුකරණය) - ප්‍රතිපත්තිමය වෙනසක් හේතුවෙන් බදු ගෙවන්නන්ගේ හැසිරීම් සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සිදුවිය හැකි වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, අහිමිවන බදු ආදායම ඉවත් කිරීමෙන් හෝ වෙනස් කිරීමෙන් ලබාගත හැකි අතිරේක ආදායම මෙයින් තක්සේරු කෙරේ.

iii. වියදම් සමානතා ප්‍රවේශය - අදාළ බදු සහන හරහා බදු ගෙවන්නන්ට ලබා දෙන මූල්‍ය ප්‍රතිලාභයට සමාන ප්‍රතිලාභයක් ලබා දීම සඳහා, රජය විසින් සෘජුවම දැරිය යුතු වියදම් ප්‍රමාණය මෙයින් තක්සේරු කෙරේ.

මෙම ප්‍රකාශයේ ඇති ගණනය කිරීම් අහිමි වන බදු ආදායම පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රවේශය යටතේ, බදු ගෙවන්නන්ගේ හැසිරීම් සහ අනෙකුත් අදාළ ආර්ථික තත්ත්වයන් නොවෙනස්ව පවතින බව උපකල්පනය කරමින්, බදු ආදායම අහිමිවීමට අදාළ වූ ප්‍රතිපාදනය ක්‍රියාත්මක නොවූයේ නම්, රජය විසින් එකතු කළ හැකිව තිබූ ආදායම තක්සේරු කෙරේ.

අහිමි වන බදු ආදායම ඉවත් කිරීමෙන් හෝ වෙනස් කිරීමෙන් පසු බදු ගෙවන්නන්ගේ හැසිරීම් රටාවන්හි සිදුවිය හැකි වෙනස්කම් හේතුවෙන් ඇතිවන ගතික බලපෑම් නොමැති බව උපකල්පනය කරමින් මෙම ඇස්තමේන්තුව සිදු කරයි. බදු ගෙවන්නන්ගේ අනුකූලතා හැසිරීම නොවෙනස්ව පවතින බවත්, බදු ආදායම් අහිමි වීම් සම්බන්ධ මිනුම් අතර අන්තර්ක්‍රියාකාරීත්වයන් හෝ අන්‍යෝන්‍ය රඳාපැවැත්ම සැලකිය යුතු මට්ටමකින් නොපවතින බවත් උපකල්පනය කෙරේ.

බදු ආදායම් අහිමි වීම් ප්‍රවේශය මඟින් අහිමි වන බදු ආදායම ඉවත් කිරීම තුළින් සත්‍ය වශයෙන්ම අත්පත් කරගත හැකි විභව බදු ආදායම අධි තක්සේරු වීමට ඉඩකඩ පවතී. මෙම ප්‍රවේශය තුළ බදු ගෙවන්නන්ගේ හැසිරීම් ප්‍රතිචාර, ආර්ථික ක්‍රියාකාරකම්වල සිදුවන වෙනස්කම් හෝ වෙනත් ගතික බලපෑම් සැලකිල්ලට නොගැනීම මේ සඳහා හේතු වී ඇත. කෙසේ වෙතත්, බදු ආදායම අහිමි වීම් ඇස්තමේන්තු කිරීම සහ වාර්තා කිරීම සඳහා සාපේක්ෂව සරල, විනිවිදභාවයෙන් යුත් සහ ස්ථාවර පදනමක් මෙමඟින් සපයනු ලබයි. ඒ අනුව, බදු ආදායම් අහිමි වීමේ මූලික මිනුම්කරණය සහ වාර්තාකරණය සඳහා මෙම ප්‍රවේශය බහුලව භාවිත වේ.

1.7 2025 වසරේ නොවැම්බර් මස ප්‍රකාශයට පත්කරන ලද බදු ආදායම අහිමිවීම පිළිබඳ ප්‍රකාශයේ සිට මෙම ප්‍රකාශය දක්වා සිදුව ඇති වෙනස්කම්

ශ්‍රී ලංකාවේ බදු ආදායම් අහිමි වීම් වාර්තාකරණ රාමුවේ නිරවද්‍යතාව, අනුකූලතාව, සංසන්දනාත්මකභාවය සහ ප්‍රතිපත්තිමය අදාළත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින්, බදු ආදායම් අහිමි වීම පිළිබඳ ප්‍රකාශයේ ක්‍රමවේදමය සහ විෂය පථය සම්බන්ධ වැඩිදියුණු කිරීම් කිහිපයක් මෙම සංස්කරණයෙහි ඇතුළත් කර ඇත. ප්‍රධාන වෙනස්කම් පහත පරිදි වේ.

- ඇගයීම් ආරම්භ කිරීම:

  ප්‍රධාන බදු ආදායම් අහිමි වීම සම්බන්ධයෙන් පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණ සිදු කිරීම සඳහා ඇගයීම් ක්‍රියාවලියක් හඳුන්වා දී ඇත. මෙයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති බදු දිරිගැන්වීම් පිළිබඳ පූර්ව පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණ සහ පසු අධීක්ෂණ මෙන්ම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යටතේ ලබා දී ඇති බදු දිරිගැන්වීම් පිළිබඳ තාක්ෂණික විශ්ලේෂණ සහ පසු අධීක්ෂණය ද ඇතුළත් බහු වාර්ෂික සැලැස්මක් හඳුන්වා දී ඇත.

- වාර්ෂික සැසඳීම:

  අහිමි වන බදු ආදායමේ වාර්ෂික සැසඳීම හඳුන්වා දී ඇත්තේ බදු සහනවල මූල්‍ය පිරිවැයේ කාලයත් සමඟ සිදුවන වෙනස්කම් තක්සේරු කිරීමට සහ අහිමි වන බදු ආදායමේ සැලකිය යුතු වැඩිවීම් හෝ අඩුවීම් හඳුනා ගැනීමටත් වේ.

- ජාත්‍යන්තර වශයෙන් සැසඳීම:

  ශ්‍රී ලංකාවේ බදු ආදායම් අහිමිවීමේ රාමුව තෝරාගත් රටවල් කිහිපයක් සමඟ සැසඳීමටත්, ප්‍රමාණනය කිරීම, ඇගයීම, විනිවිදභාවය සහ වාර්තාකරණය යන අංශවල වැඩිදියුණු කිරීම් සිදු කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමටත් හැකි වන පරිදි, බදු ආදායම අහිමිවීමේ ඇස්තමේන්තු සහ වාර්තාකරණ පිළිවෙත් පිළිබඳ ජාත්‍යන්තර සැසඳීමක් හඳුන්වා දී ඇත.

- බදු දිරිගැන්වීම් සඳහා කාලසීමා නිර්ණය කිරීමේ විධිවිධාන :

  2025 අංක 26 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධිත) පනත සහ 2026 අංක 1 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධිත) පනත මඟින් බදු දිරිගැන්වීම් ලබාදීම සඳහා නිශ්චිත කාලසීමා නියම කිරීම තුළින් බදු දිරිගැන්වීම් රාමුව තවදුරටත් ශක්තිමත් කර ඇත.

- ප්‍රතිපත්තිමය තාර්කික පදනමක් මත අහිමි වන බදු ආදායම් වර්ගීකරණය:

  අහිමි වන බදු ආදායම් ඒවාට අදාළ මූලික ප්‍රතිපත්තිමය අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිඵල කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඉදිරිපත් කර ඇති අතර, එමඟින් රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සමඟ ඒවායේ ඇති තාර්කික පදනම සහ අදාළත්වය වඩාත් පැහැදිලිව ඇගයීමට පහසුකම් සැලසේ.

- අහිමි වන බදු ආදායම සම්බන්ධ පාරිභාෂිතය වැඩිදියුණු කිරීම:

  අහිමි වන බදු ආදායම් වාර්තාකරණයේ පැහැදිලි බව, අනුකූලතාව සහ සැසඳිය හැකි බව ඉහළ නැංවීම සඳහා, අහිමි වන බදු ආදායම්වලට අදාළ ප්‍රධාන පාරිභාෂිතයන් ප්‍රමිතිගත කර පැහැදිලිව අර්ථ දක්වා ඇත.

1.8 සීමාවන් සහ දත්ත සලකා බැලීම්

- පවතින තත්ත්වයන් වෙනස් නොවන බවට වන උපකල්පනය:

  බදු ආදායම් අහිමිවීම තක්සේරු කරනු ලබන්නේ, වෙනත් සියලු තත්ත්වයන් නොවෙනස්ව පවතී යන උපකල්පනය මතය. බදු ගෙවන්නන්ගේ චර්යාවේ සිදුවිය හැකි වෙනස්කම්, ආර්ථික තත්ත්වයන් හෝ බදු ආදායමට බලපෑ හැකි වෙනත් සාධකවල සිදුවිය හැකි වෙනස්වීම් මෙහිදී සැලකිල්ලට නොගැනේ.

- විශේෂ ව්‍යාපෘති සඳහා ලබාදෙන බදු දිරිගැන්වීම්:

  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අදාළ ව්‍යාපෘති, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ කොළඹ වරාය නගර ව්‍යාපෘති ඇතුළු ප්‍රධාන ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන්, සත්‍ය රාජ්‍ය මූල්‍ය පිරිවැය රඳා පවතින්නේ ආයෝජන බැඳීම් ක්‍රියාත්මක කිරීම සහ රැකියා උත්පාදනය, නිෂ්පාදනය, අපනයනය මෙන්ම ව්‍යාපෘතියට අදාළ වෙනත් ප්‍රතිඵල අත්කර ගැනීම මතය. එබැවින්, පූර්ව ඇස්තමේන්තු සහ පසුව සත්‍ය වශයෙන්ම අහිමි වන බදු ආදායම අතර වෙනසක් පැවතිය හැකිය.

- සීමිත ව්‍යාප්ති විශ්ලේෂණය :

  දැනට අහිමි වන බදු ආදායම පිළිබඳ ප්‍රකාශය මගින්, ආදායම් කාණ්ඩ, අංශ, ව්‍යාපාර ප්‍රමාණයන්, කලාප සහ බදු ගෙවන්නන්ගේ කාණ්ඩ අනුව අහිමි වන බදු ආදායම්වල ව්‍යාප්තියේ බලපෑම පිළිබඳව සීමිත විශ්ලේෂණයක් සපයයි. එමගින්, අහිමි වන බදු ආදායම තක්සේරු කිරීම පිළිබඳ සාධාරණත්වය, ඉලක්කගත බව සහ කාර්යක්ෂමතාව සීමා කරනු ලබයි.

- සවිස්තරාත්මක සැපයුම් හා භාවිත වගු සහ පරිභෝජනය පිළිබඳ සවිස්තරාත්මක දත්ත ප්‍රමාණවත් පරිදි නොමැති වීම :

  එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සම්බන්ධ අහිමි වන බදු ආදායම් ඇස්තමේන්තු ගණනය කරනු ලබන්නේ ලියාපදිංචි බදු ගෙවන්නන් විසින් ඉදිරිපත් කරන බදු ප්‍රකාශන වල ඇතුළත් තොරතුරු පමණක් පදනම් කරගෙනය. මෙය සැලකිය යුතු සීමාවක් වන අතර, රටක පවතින හෝ තිබිය හැකි ආර්ථික සැපයුමේ සත්‍ය පරිමාණය පූර්ණ වශයෙන් නිරූපණය නොවේ. අහිමි වූ ආදායමේ නිශ්චිත ප්‍රමාණය ගණනය කිරීම සඳහා, බදු ගෙවන්නන් විසින් වාර්තා කළ ආදායම, සමස්ත ජාතික සැපයුම් දත්ත සමඟ සැසඳිය යුතුය. කෙසේ වෙතත්, මෙම සැසඳීම සඳහා අවශ්‍ය වන සවිස්තරාත්මක සැපයුම් හා භාවිත වගු සහ පරිභෝජනය පිළිබඳ සවිස්තරාත්මක දත්ත ප්‍රමාණවත් පරිදි ලබාගත නොහැකි වීම ප්‍රධාන බාධාවක් වේ. සමස්ත විභව සැපයුම සහ විධිමත් ලෙස වාර්තා කර ඇති ප්‍රමාණය අතර පවතින වෙනස නිවැරදිව ගණනය කිරීමට නොහැකි වීම හේතුවෙන්, එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සම්බන්ධයෙන් ඇස්තමේන්තු කර ඇති බදු ආදායම්, රජයට අහිමි වන සමස්ත බදු ආදායමේ නිරපේක්ෂ එකතුව ලෙස නොව, අවම අගයක් ලෙස සැලකිය යුතුය.

වගුව 1.7 : ශ්‍රී ලංකාවේ බදු ආදායම අභිමිවීම් වාර්තාකරණ පිළිවෙත් සහ ජාත්‍යන්තර යහපත් පරිවයන් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය

අංශය	ශ්‍රී ලංකාව	ජාත්‍යන්තර පරිවයන්
ප්‍රතිලාභීන් පිළිබඳ විශ්ලේෂණය	බදු ආදායම් අභිමිවීම්වලට අදාළ ප්‍රතිලාභීන් පිළිබඳව තොරතුරු සීමිත වේ.	ඉන්දුනීසියාව - ප්‍රතිලාභ ලබන අංශ සහ බදු ගෙවන්නන්ගේ කාණ්ඩ අනුව අභිමි වන බදු ආදායම් ඉදිරිපත් කරයි.
ව්‍යාප්ති විශ්ලේෂණය	ව්‍යාප්ති බලපෑම් ක්‍රමානුකූලව ඉදිරිපත් නොකෙරේ.	ඕස්ට්‍රේලියාව - විවිධ ආදායම් ලබන කාණ්ඩවලට ඇතිවන බලපෑම් ඇතුළුව ප්‍රධාන බදු ආදායම් අභිමිවීම් මඟින් ඇතිවන බලපෑම ව්‍යාප්ති විශ්ලේෂණය තුළින් ඉදිරිපත් කරයි.
ප්‍රතිපත්තිමය අරමුණු	බදු ආදායම් අභිමිවීම්වල අදාළ අරමුණු හඳුනාගෙන ඇති නමුත්, ඒවා අදාළ ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීමට දක්වන දායකත්වය ඇගයීම අවම වශයෙන් සිදු කෙරේ.	ඉන්දුනීසියාව - ආයෝජන, රැකියා උත්පාදනය සහ ආර්ථික සංවර්ධනය ඇතුළුව නිශ්චිත ප්‍රතිපත්තිමය අරමුණු සමඟ බදු ආදායම් අභිමිවීම් සමඟ ඇති සම්බන්ධය ඉදිරිපත් කරයි.
පිරිවැය - ඵලදායීතාව ඇගයීම	ක්‍රමානුකූල පිරිවැය - ප්‍රතිලාභ සහ ඵලදායීතාව ඇගයීම අවම වශයෙන් සිදු කෙරේ.	කැනඩාව - තෝරාගත් බදු ප්‍රතිපාදනවල ඵලදායීතාව සහ ප්‍රතිපත්තිමය බලපෑම් ඇගයීම සඳහා විශ්ලේෂණයන් සිදු කරයි.
බහු - වාර්ෂික විශ්ලේෂණය	ප්‍රධාන වශයෙන් විශ්ලේෂණය වත්මන් වාර්තාකරණ කාලපරිච්ඡේදයට පමණක් අවධානය යොමු කරයි.	කැනඩාව - බදු ආදායම් අභිමිවීම පිළිබඳ පැරණි ඇස්තමේන්තු සහ ඉදිරි වසර සඳහා පුරෝකථන ඉදිරිපත් කරයි.
පුරෝකථනය සහ සත්‍ය පිරිවැය අතර සැසඳීම	ක්‍රමානුකූලව සැසඳීම සීමිත වේ.	එක්සත් රාජධානිය - පුරෝකථනය කළ බදු සහන පිරිවැය සහ සත්‍ය පිරිවැය අතර සැසඳීම් සිදු කරමින් සැලකිය යුතු වෙනස්කම් විශ්ලේෂණය කරයි.
සෘජු රාජ්‍ය වියදම් සමඟ සැසඳීම	අභිමි වන බදු ආදායම් සහ සෘජු රාජ්‍ය වියදම් අතර විශ්ලේෂණය සීමිත වේ.	කැනඩාව - බදු ප්‍රතිපාදන ඇගයීමේ දී ඒවාට අදාළ රාජ්‍ය වියදම් ද සලකා බලයි.

මූලාශ්‍ර :

- *Tax Expenditure Report 2024.- ඉන්දුනීසියාව*
- *Tax Expenditures and Insights Statement 2025–26.- ඕස්ට්‍රේලියාව,*
- *Report on Federal Tax Expenditures - Concepts, Estimates and Evaluations 2026 –කැනඩාව*
- *HM Revenue & Customs (HMRC) (2026),Tax Relief Statistics, January 2026- එක්සත් රාජධානිය*

1.9 ඉදිරි මඟ : ඇගයීම සහ ප්‍රතිසංස්කරණ

මෙම බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශනය නිකුත් කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් වේ. බදු ආදායම් අභිමිවීම වාර්තාකරණයේ ගුණාත්මකභාවය, විනිවිදභාවය සහ පරිපූර්ණත්වය තවදුරටත් ඉහළ නැංවීම සඳහා මුදල් අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ අනෙකුත් අදාළ ආයතන කැපවී සිටී.

- බහු - වාර්ෂිකව අභිමි වන බදු ආදායම් විශ්ලේෂණය සංවර්ධනය කිරීම:

  රාජ්‍ය මූල්‍ය පිරිවැයේ ප්‍රවණතා හඳුනා ගැනීම සහ එවැනි බදු ආදායම් අභිමිවීම පිළිබඳ තිරසරභාවය තක්සේරු කිරීම සඳහා වසර කිහිපයක ප්‍රධාන බදු ආදායම් අභිමිවීම් නිරීක්ෂණය කිරීම.

- ව්‍යාප්ති විශ්ලේෂණය හඳුන්වා දීම:

  බදු ආදායම් අභිමිවීම්වල ආදායම් කාණ්ඩ, අංශ, සමාගමේ ප්‍රමාණය, කලාපය සහ බදු ගෙවන්නන්ගේ කාණ්ඩය අනුව ප්‍රධාන බදු ආදායම් අභිමිවීම්වලින් ලැබෙන ප්‍රතිලාභ තක්සේරු කිරීම, සාධාරණත්වය සහ ඉලක්කගත කිරීම ඇගයීම.

- ප්‍රතිලාභී තොරතුරුවල විනිවිදභාවය වැඩි දියුණු කිරීම:

  රහස්‍යතා අවශ්‍යතාවලට යටත්ව, ප්‍රතිලාභීන් පිළිබඳ සමස්ත තොරතුරු සහ ප්‍රධාන බදු දිරිගැන්වීම්වල මූල්‍ය පිරිවැය හෙළිදරව් කිරීම වැඩි දියුණු කිරීම.

II වන කොටස

බදු ආදායම් අභිමිවීම පිළිබඳ ඇස්තමේන්තු

2 වන පරිච්ඡේදය - බදු වර්ගය අනුව බදු ආදායම් අභිමිවීම පිළිබඳ සමාලෝචනය සහ විශ්ලේෂණය

මෙම පරිච්ඡේදය මඟින් සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද සහ රේගු ආනයන බද්ද යටතේ බදු ආදායම් අභිමිවීම පිළිබඳ ඒකාබද්ධ සාරාංශයක් සහ විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ. මෙමඟින්, එක් එක් බදු වර්ගය යටතේ ප්‍රධාන සහන ක්‍රියාමාර්ග හඳුනාගන්නා අතර, ඒවායේ රාජ්‍ය මූල්‍ය වැදගත්කම සහ සංයුතිය සලකා බලනු ලැබේ.

2.1 වගුව මඟින් 2025 වසර සහ 2026 වසරේ පළමු භාගය සඳහා බදු ආදායම අභිමි වීම පිළිබඳ ඇස්තමේන්තු ඉදිරිපත් කෙරේ. සංස්ථාපිත ආදායම් බද්ද සහ පුද්ගල ආදායම් බද්ද තක්සේරු වර්ෂය අනුව වාර්තා කර ඇති අතර, අනෙකුත් බදු 2025 වසර සහ 2026 වසරේ පළමු භාගය සඳහා වෙන් වෙන්ව වාර්තා කර ඇත.

2024/2025 සඳහා ප්‍රකාශයට පත් කළ බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය පදනම් කර ගනිමින්, 2025/2026 බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය මඟින් 2025 වසර සහ 2026 වසරේ පළමු භාගය සඳහා බදු ආදායම් අභිමි වීම පිළිබඳ ඇස්තමේන්තු සම්බන්ධයෙන් සංසන්දනාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ. විවිධ බදු උපකරණ තුළින් බදු ආදායම් අභිමි වන ප්‍රමාණය සහ සංයුතියේ වෙනස්කම් මෙම විශ්ලේෂණය මඟින් ඉස්මතු කරන අතර, කාලයත් සමඟ ඒවායේ වර්ධනය අධීක්ෂණය කිරීම සඳහා පදනමක් සපයයි. බදු සහන ක්‍රියාමාර්ගවල ඵලදායීතාව සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය අඛණ්ඩව ඇගයීමට මෙම සොයාගැනීම් උපකාරී වන අතර, ආදායම් රැස් කිරීම සහ වියදම් තාර්කීකරණය සම්බන්ධ අනාගත ප්‍රතිපත්තිමය තීරණ සඳහා තොරතුරු සපයයි.

වගුව 2.1 : බදු වර්ගය අනුව අභිමි වන බදු ආදායම


රු. මිලියන

සෘජු බදු	අභිමිවන බදු ආදායම	
	2023/24	2024/25
සංස්ථාපිත ආදායම් බද්ද	119,290	186,069
පුද්ගල ආදායම් බද්ද	10,461	36,278


වක්‍ර බදු	අභිමිවන බදු ආදායම			
	2023	2024	2025	2026 පළමු භාගය
එකතු කළ අගය මත බද්ද	-	333,295	419,251	242,954
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	-	-	216,283	135,270
නිෂ්පාදන බද්ද (විශේෂ විධිවිධාන)	-	9,967	16,254	9,023
රේගු ආනයන බද්ද	-	138,426	144,473	74,247
මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද	480	1,800	-	-

මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

රූප සටහන 2.1 : වාර්තාකරණ කාලපරිච්ඡේදය අනුව අහිමි වන බදු ආදායම් සාරාංශය



මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව



මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව

2.1 සංස්ථාපිත ආදායම් බද්ද

ඇස්තමේන්තුගත සංස්ථාපිත බදු ආදායම අභිමිවීම 2023/24 තක්සේරු වසරේ දී වූ රු. මිලියන 119,290 සිට 2024/25 තක්සේරු වසරේ රු. මිලියන 186,069 දක්වා සියයට 56.0 කින් වැඩි විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා වාර්තා වූ ඉහළ සහන සහ බදු නිදහස් කිරීම් හේතු විය.

වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා අදාළ සහනදායී බදු අනුපාත හේතුවෙන් 2024/25 වසරේ බදු ආදායම් අහිමි වීම රු. මිලියන 106,904 ක් වූ අතර, එම සමාගම්වලට ලබා දුන් බදු නිදහස් කිරීම් හේතුවෙන් ඇති වූ බදු ආදායම් අභිමිවීම රු. මිලියන 14,594 ක් විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාණ්ඩය තුළ, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අදාළ සහනදායී බදු අනුපාත හේතුවෙන් ඇති වූ බදු ආදායම් අභිමිවීම රු. මිලියන 84 ක් වූ අතර, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති නොවන ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම් හේතුවෙන් ඇති වූ බදු ආදායම් අභිමිවීම රු. මිලියන 52,967 ක් විය.

අනුමත ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කිරීම සහ අදාළ නීති රාමුව යටතේ සපයනු ලබන දිරිගැන්වීම් සඳහා සුදුසුකම් ලැබීමත් සමඟ, වරාය නගර ව්‍යාපෘති ආශ්‍රිත බදු ආදායම් අභිමිවීම මධ්‍ය කාලීනව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වගුව 2.2 : සංස්ථාපිත ආදායම් බදු අභිමිවීම

රු. මිලියන

අංශය		ආදායම අභිමිවන ආකාරය	අහිමි වන බදු ආදායම	
			2023/24	2024/25(අ)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති	සහනදායී බදු අනුපාතය	-	84
		බදු නිදහස් කිරීම්	123	-
	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති නොවන	සහනදායී බදු අනුපාතය	41,682	11,520
		බදු නිදහස් කිරීම්	-	52,967
වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම්		සහනදායී බදු අනුපාතය	72,740	106,904
		බදු නිදහස් කිරීම්	4,602	14,594
වරාය නගර ව්‍යාපෘති		සහනදායී බදු අනුපාතය	-	-
		බදු නිදහස් කිරීම්	143	-
එකතුව			**119,290**	**186,069**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇත.
(අ) - තාවකාලික

2.2 පුද්ගල ආදායම් බද්ද

ඇස්තමේන්තුගත පුද්ගල ආදායම් බදු අභිමිවීම 2023/24 තක්සේරු වසරේ දී වූ රු. මිලියන 10,461 සිට 2024/25 වසරේ රු. මිලියන 36,278 දක්වා සියයට 246.8 කින් ඉහළ ගොස් ඇත.

රු. මිලියන 25,817 ක් වූ මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන්ම බද්දෙන් නිදහස් කළ සහ බදු ගණනයෙන් බැහැර කළ ආදායම් කාණ්ඩය තුළින් පිළිබිඹු විය. එය 2024/25 තක්සේරු වසරේ පුද්ගල ආදායම් බද්දට අදාළ ඇස්තමේන්තුගත බදු ආදායම් අභිමි වීමේ විශාලතම සංරචකය වූ රු. මිලියන 32,354 ක් වූ අතර, එය මුළු ආදායම් බදු ආදායම් අභිමිවීමෙන් ආදායමෙන් සියයට 89.2 ක් වේ.


වගුව 2.3 : පුද්ගල ආදායම් බදු අභිමිවීම

රු. මිලියන

විස්තරය	අභිමි වන බදු ආදායම	
	2023/24	2024/25(අ)
සහන සහ සුදුසුකම් ලබන ගෙවීම්	8,191	3,924
බද්දෙන් නිදහස් කළ/බදු ගණනයෙන් බැහැර කළ ආදායම	2,270	32,354
එකතුව	**10,461**	**36,278**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇත.
(අ) - තාවකාලික

රූප සටහන 2.2 : පුද්ගල ආදායම් බදු අභිමිවීම - 2024/2025



2.3 එකතු කළ අගය මත බද්ද

ඇස්තමේන්තුගත එකතු කළ අගය මත බදු ආදායම් අභිමිවීම 2024 වසරේ දී වූ රු. මිලියන 333,295 සිට 2025 වසරේ රු. මිලියන 419,251 දක්වා සියයට 25.8 කින් ඉහළ ගිය අතර, එම වැඩි වීම රු. මිලියන 85,956 ක් විය. 2025 වසරේ පළමු භාගයේ දී වූ රු. මිලියන 207,359 ට සාපේක්ෂව එකතු කළ අගය මත බද්දට අදාළ ඇස්තමේන්තුගත බදු ආදායම් අභිමිවීම 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 242,954 දක්වා සියයට 17.2 කින් වැඩි විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් හා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා බදු ආදායම් අභිමිවීම පිළිවෙළින් රු. මිලියන 18,894 හා රු. මිලියන 127 ක් වූ අතර ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් එකතු කළ අගය මත බදු ආදායම් අභිමි වීමේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස අඛණ්ඩව පැවතුණු අතර එය රු. මිලියන 223,933ක් විය. මෙම කාණ්ඩවල එකතුකළ අගය මත බදු ආදායම අභිමිවීම රු. මිලියන 242,954 ක් විය. මෙම කාණ්ඩය තුළ, 2025 වසරේ දී මෙන්ම 2026 වසරේ පළමු භාගයේ දී ඉහළම එකතු කළ අගය මත බදු ආදායම් අභිමි වීම වාර්තා වූයේ තොග සහ සිල්ලර වෙළඳ අංශයෙනි.

නව සහන ලබාදීම හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් අභිමි වූ ආදායම - දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කරනු ලබන දියර කිරි සහ යෝගට් සැපයීම, 2025 අප්‍රේල් 11 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

වගුව 2.4 : අභිමී වන එකතු කළ අගය මත බදු ආදායම් සාරාංශය

රු. මිලියන

විස්තරය	අභිමී වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම්	28,133	18,894
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම්	390,832	223,933
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති	286	127
එකතුව	**419,251**	**242,954**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇත.
(අ) - තාවකාලික

වගුව 2.5 : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් සඳහා අංශ අනුව එකතු කළ අගය මත බදු ආදායම් අභිමීවීම

රු. මිලියන

අංශය	අභිමී වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
නිෂ්පාදන - කෘෂිකර්මාන්තය	41	27
නිෂ්පාදන - මධ්‍යසාර නොවන පාන වර්ග	5	1
නිෂ්පාදන - අනෙකුත්	15,704	8,723
නිෂ්පාදන - රෙදිපිළි සහ ඇඟලුම්	621	528
සේවා - ඉදිකිරීම්	19	11
සේවා - විදුලිය සහ ගෑස්	349	226
සේවා - අනෙකුත්	1,560	1,105
සේවා - විදුලි සංදේශ	236	110
සේවා - සංචාරක	152	69
සේවා - ප්‍රවාහන	0.1	0.2
සේවා - තොග සහ සිල්ලර වෙළඳාම	9,277	7,985
අනෙකුත්	168	108
එකතුව	**28,133**	**18,894**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇත.
(අ) - තාවකාලික

වගුව 2.6 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා අංශ අනුව එකතු කළ අගය මත බදු ආදායම් අභිමිවීම

රු. මිලියන

අංශය	අභිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
නිෂ්පාදන - කෘෂිකර්මාන්තය	5,183	3,124
නිෂ්පාදන - මධ්‍යසාර නොවන පාන වර්ග	106	72
නිෂ්පාදන - අනෙකුත්	46,920	27,281
නිෂ්පාදන - රෙදිපිළි සහ ඇඟලුම්	2,418	1,271
සේවා - ඉදිකිරීම්	38,087	8,207
සේවා - විදුලිය සහ ගෑස්	65,293	36,404
සේවා - අනෙකුත්	21,775	11,653
සේවා - විදුලි සංදේශ	71	41
සේවා - සංචාරක	1,225	811
සේවා - ප්‍රවාහන	3,948	2,006
සේවා - ජල සැපයුම්	137	104
සේවා - තොග සහ සිල්ලර වෙළඳාම	188,130	113,397
අනෙකුත්	17,539	19,563
එකතුව	**390,832**	**223,933**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇත.
(අ) - තාවකාලික

වගුව 2.7 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අංශ අනුව එකතු කළ අගය මත බදු ආදායම් අභිමිවීම

රු. මිලියන

අංශය	අභිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
නිෂ්පාදන - රෙදිපිළි සහ ඇඟලුම්	-	11
සේවා - ඉදිකිරීම්	-	0.1
සේවා - සංචාරක	284	115
සේවා - ප්‍රවාහන	2	1
එකතුව	**286**	**127**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇති අතර, හඳුනාගන්නා ලද දෝෂ 2025 වසර සඳහා නිවැරදි කර ඇත.
(අ) - තාවකාලික

2.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2025 වසරේ සහ 2026 වසරේ පළමු භාගයේ දී, ඇස්තමේන්තුගත සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමි වීම පිළිවෙලින් රු. මිලියන 216,283 ක් හා රු. මිලියන 135,270 ක් විය. 2026 වසරේ පළමු භාගය තුළ, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම රු. මිලියන 125,082 ක් වූ අතර, එය මුළු බදු අහිමි වීමේ විශාලතම කොටස නියෝජනය කරන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම්, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති සඳහා වූ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම පිළිවෙළින්, රු. මිලියන 10,120 ක්, රු. මිලියන 55 ක් සහ රු. මිලියන 13 ක් විය.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් කාණ්ඩය තුළ, 2026 වසරේ පළමු භාගය සඳහා ඉහළම සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීම තොග සහ සිල්ලර වෙළෙඳ අංශයෙන් වාර්තා වූ අතර, ඉන් අනතුරුව අනෙකුත් නිෂ්පාදන කටයුතු, රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය සහ ප්‍රවාහන අංශ ඉහළම බදු ආදායම් අහිමිවීම වාර්තා කර ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාණ්ඩය තුළ ද ඉහළම බදු ආදායම් අහිමිවීම තොග සහ සිල්ලර වෙළඳ අංශයෙන් වාර්තා වූ අතර, ඉන් අනතුරුව රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය සහ අනෙකුත් නිෂ්පාදන කටයුතු පිළිවෙළින් ඉහළම බදු ආදායම් අහිමිවීම වාර්තා කර ඇත. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ අහිමි වන බදු ආදායමෙන් විශාලතම කොටස ඉදිකිරීම් සේවා අංශයට අයත් විය.

වගුව 2.8 : සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අහිමිවීමේ සාරාංශය

රු. මිලියන

විස්තරය	අහිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම්	15,759	10,120
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම්	200,420	125,082
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති	93	55
වරාය නගරය	11	13
එකතුව	**216,283**	**135,270**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇත.
(අ) - තාවකාලික

වගුව 2.9 : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් සඳහා අංශ අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අභිමිවීම

රු. මිලියන

අංශය	අහිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
නිෂ්පාදන - කෘෂිකර්මාන්තය	95	47
නිෂ්පාදන - මධ්‍යසාර නොවන පාන වර්ග	1	0.4
නිෂ්පාදන - අනෙකුත්	3,623	1,870
නිෂ්පාදන - රෙදිපිළි සහ ඇඟලුම්	5,897	2,593
සේවා - ඉදිකිරීම්	0.3	-
සේවා - විදුලිය සහ ගෑස්	26	121
සේවා - අනෙකුත්	1,364	670
සේවා - විදුලි සංදේශ	125	41
සේවා - සංචාරක	232	135
සේවා - ප්‍රවාහන	8	5
සේවා - තොග සහ සිල්ලර වෙළඳාම	3,919	4,435
අනෙකුත්	470	202
එකතුව	**15,759**	**10,120**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇති අතර, හඳුනාගන්නා ලද දෝෂ 2025 වසර සඳහා නිවැරදි කර ඇත.
(අ) - තාවකාලික

වගුව 2.10 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර ව්‍යාපෘති හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා අංශ අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අභිමිවීම

රු. මිලියන

අංශය	අහිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
නිෂ්පාදන - කෘෂිකර්මාන්තය	966	446
නිෂ්පාදන - මධ්‍යසාර නොවන පාන වර්ග	33	21
නිෂ්පාදන - අනෙකුත්	19,945	8,980
නිෂ්පාදන - රෙදිපිළි සහ ඇඟලුම්	15,991	8,041
සේවා - බැංකු, රක්ෂණ සහ කල්බදු	3,104	2,775
සේවා - ඉදිකිරීම්	6,610	1,508
සේවා - විදුලිය සහ ගෑස්	110	48
සේවා - අනෙකුත්	66,935	2,246
සේවා - විදුලි සංදේශ	116	58
සේවා - සංචාරක	1,867	1,207
සේවා - ප්‍රවාහන	13,768	7,679
සේවා - ජල සැපයුම්	2,103	1,104
සේවා - තොග සහ සිල්ලර වෙළඳාම	54,234	41,131
අනෙකුත්	14,638	49,840
එකතුව	**200,420**	**125,082**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇති අතර, හඳුනාගන්නා ලද දෝෂ 2025 වසර සඳහා නිවැරදි කර ඇත.
(අ) - තාවකාලික

වගුව **2.11 : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අංශ අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අභිමිවීම**

රු. මිලියන

අංශය	අහිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
නිෂ්පාදන - වෙනත්	0.04	0.01
සේවා - ඉදිකිරීම්	20	11
සේවා - සංචාරක	08	11
සේවා - ප්‍රවාහන	65	33
එකතුව	**93**	**55**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇති අතර, හඳුනාගන්නා ලද දෝෂ 2025 වසර සඳහා නිවැරදි කර ඇත.
(අ) - තාවකාලික

වගුව **2.12 : කොළඹ වරාය නගර ව්‍යාපෘති සඳහා අංශය අනුව අහිමි වන සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම් අභිමිවීම**

රු. මිලියන

අංශය	අහිමි වන බදු ආදායම	
	2025(අ)	2026 පළමු භාගය(අ)
සේවා - අනෙකුත්	11	13
එකතුව	**11**	**13**

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සටහන: බදු ගෙවන්නාගේ ප්‍රකාශය පදනම් කරගෙන මෙය සකස් කර ඇති අතර, හඳුනාගන්නා ලද දෝෂ 2025 වසර සඳහා නිවැරදි කර ඇත.
(අ) - තාවකාලික

2.5. නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද

ඇස්තමේන්තුගත නිෂ්පාදන බදු ආදායම් අභිමිවීම 2024 වසරේ දී වූ රු. මිලියන 9,967 සිට 2025 වසරේ රු. මිලියන 16,254 දක්වා සියයට 63.1කින් වැඩි විය. නිෂ්පාදන බදු ආදායම අභිමිවීමෙන් බහුතරයක් එනම්, රු. මිලියන 16,156 ක් දේශීයව එකලස් කරන ලද වාහන සඳහා බදු නිදහස් කිරීම් වන අතර, එය සමස්ත බදු ආදායම් අභිමිවීමෙන් සියයට 99.4 ක් විය. දේශීයව එකලස් කරන ලද වාහන සංඛ්‍යාව 2024 වසරේ 55,377 සිට 2025 වසරේ දී 96,472 දක්වා සියයට 74.2 කින් ඉහළ යන ලදී.

2026 වසරේ පළමු භාගය තුළ ඇස්තමේන්තුගත නිෂ්පාදන බදු ආදායම් අභිමිවීම රු. මිලියන 9,023 ක් විය. එයින්, දේශීයව එකලස් කරන ලද වාහන සම්බන්ධ බදු නිදහස් කිරීම් හේතුවෙන් ඇති වූ බදු ආදායම අභිමිවීම රු. මිලියන 9,005 ක් වූ අතර, එය සමස්ත බදු ආදායම් අභිමිවීමෙන් සියයට 99.8 ක් විය.

වගුව 2.13 : නිෂ්පාදන බදු ආදායම් අභිමිවීම

රු. මිලියන

අභිමිවීම් විස්තරය	අභිමිවන බදු ආදායම		
	2024(අ)	**2025(ආ)**	**2026 පළමු භාගය(ආ)**
වරාය නගර තීරු බදු රහිත සාප්පු - ආනයන	250	94	8
දේශීයව එකලස්කරන ලද වාහන	9,717	16,156	9,005
ලියාපදිංචි අවමංගල්‍ය සේවා සපයන්නන් විසින් ආනයනය කරනු ලබන අවමංගල්‍ය රථ	-	4	10
එකතුව	**9,967**	**16,254**	**9,023**

මූලාශය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
(අ) - සංශෝධිත
(ආ) - තාවකාලික

2.6. රේගු ආනයන බද්ද

ඇස්තමේන්තුගත රේගු ආනයන බදු ආදායම අභිමිවීම 2024 වසරේ දී වූ රු. මිලියන 138,425.6 සිට 2025 වසරේ රු. මිලියන 144,473.1 දක්වා සියයට 4.4 කින් වැඩි විය. 2025 වසරේ රේගු ආනයන බදු ආදායම් අභිමිවීමෙන් විශාලතම කොටස රේගු ආඥාපනතේ 19අ වගන්තිය යටතේ සාමාන්‍ය කාර්යයන් සහ විශේෂ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු සහනවලින් ඇති වූ අතර, එහි වටිනාකම රු. මිලියන 131,489.1 ක් සහ ප්‍රතිශතයක් ලෙස සියයට 91.0 ක් විය. 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 2,379,828 ක් වූ පෙට්‍රල් සහ ඩීසල් ආනයනවල ඒකාබද්ධ පරිමාව 2025 වසරේ දී මෙට්‍රික් ටොන් 2,509,056 දක්වා සියයට 5.4 කින් ඉහළ යාමත් සමඟ, රේගු ආඥා පනතේ 19අ වගන්තිය යටතේ ලබා දී ඇති නිදහස් කිරීම්වලින් පැන නගින රේගු ආනයන බදු ආදායම අභිමිවීම රුපියල් මිලියන 7,086.3 කින් වැඩි වූ අතර එය 2024 වසරේ දී රුපියල් මිලියන 124,402.8 සිට 2025 වසරේ දී රුපියල් මිලියන 131,489.1 දක්වා සියයට 5.7 ක් නියෝජනය කරයි. එසේම සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා භාවිත කරන බඩඉරිඟු, පරිප්පු සහ සහල් හැර අනෙකුත් අමුද්‍රව්‍ය සඳහා ලබාදුන් බදු නිදහස් කිරීම් රු. මිලියන 7,818.4 ක් වූ අතර, එය සමස්ත රේගු බදු ආදායම් අභිමිවීමෙන් සියයට 5.4 ක් විය. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි අනුබද්ධ ආයතන සඳහා යන්ත්‍රෝපකරණ සහ උපකරණ සම්බන්ධයෙන් ලබාදුන් බදු නිදහස් කිරීම් රු. මිලියන 1,121 ක් වූ අතර, එය සමස්ත බදු ආදායම අභිමිවීමෙන් සියයට 0.8 ක් විය.

2026 වසරේ පළමු භාගය තුළ ඇස්තමේන්තුගත රේගු ආනයන බදු ආදායම අභිමිවීම රු. මිලියන 74,246.9 ක් විය. එහි විශාලතම කොටස රේගු ආඥාපනතේ 19අ වගන්තිය යටතේ සාමාන්‍ය කාර්යයන් සහ විශේෂ ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු සහන හේතුවෙන් ඇති වූ අතර, එහි ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 66,683.9 ක් විය. එය සමස්ත බදු ආදායම අභිමිවීමෙන් සියයට 89.8 ක් විය. සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා භාවිත කරන බඩඉරිඟු, පරිප්පු සහ සහල් හැර අනෙකුත් අමුද්‍රව්‍ය සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම්වල වටිනාකම රු. මිලියන 4,884 ක් වූ අතර, එය සමස්ත බදු ආදායම අභිමිවීමෙන් සියයට 6.6 ක් විය. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි අනුබද්ධ ආයතන සඳහා යන්ත්‍රෝපකරණ හා උපකරණ සම්බන්ධයෙන් ලබා දුන් බදු නිදහස් කිරීම්වල වටිනාකම රු. මිලියන 178.5ක් වූ අතර, එය සමස්ත බදු ආදායම අභිමිවීමෙන් සියයට 0.24 ක් විය.

වගුව 2.14 : අංශ අනුව රේගු ආනයන බදු ආදායම් අභිමිවීම

රු. මිලියන

විස්තරය	අභිමිවන බදු ආදායම		
	2024(අ)	**2025**(ආ)	**2026** පළමු භාගය(ආ)
19අ නිදහස් කිරීම් (සාමාන්‍ය අත්හැරීම් සහ විශේෂ ව්‍යාපෘති)	124,402.8	131,489.1	66,683.9
රේගු ආනයන බදු නිදහස් කිරීම් ලබාදීම්,:			
• ජාත්‍යන්තර ගුවන් සේවය විසින් ගුවන් තොටුපළ තුළ භාවිතා කරන භූමි උපකරණ, තාක්ෂණික සැපයුම	29.7	47.7	1.3
• භාණ්ඩ ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරන බහාලුම් සහ අනෙකුත් උපාංග	1.9	1.3	0.1
• ලංකා විදුලිබල මණ්ඩලය සහ අනුබද්ධ සමාගම් සඳහා වන ඕනෑම යන්ත්‍රෝපකරණ, උපකරණ ආදිය	1,806.2	1,121.0	178.5
• තනි නිෂ්පාදන කර්මාන්තය සඳහා භාවිතා කිරීමට නියමිත නිමි සම්	51.2	30.2	19.9
• ගිලන් රථ, වෛද්‍ය, ශල්‍යකර්ම සහ දන්ත උපකරණ ඇතුළු යන්ත්‍රෝපකරණ	14.4	8.1	0.05
• සත්ත්ව හා කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු, පරිප්පු සහ සහල් හැර අනෙකුත් අමුද්‍රව්‍ය	9,219.0	7,818.4	4,884.0
• මෝටර් වාහනවල කොටස් සහ උපාංග හෝ දුම්රිය එන්ජින්	1.4	12.4	1.5
• ලෝහ ආලේපන සඳහා පමණක් භාවිතා කරන ලැකර්, ආලේපන සහ වාර්නිෂ්	115.0	38.3	36.7
• බන්ධිත ගුදම් ක්‍රමය යටතේ අනුමත ප්‍රාග්ධන භාණ්ඩ	11.0	2.5	3.7
• ඖෂධ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය	427.4	494.5	397.3
• ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි ඖෂධ	805.3	869.9	525.4
• ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය	57.4	11.8	32.3
• කෘෂිකාර්මික කටයුතු සඳහා ද්‍රව්‍ය	450.2	393.5	146.3
• සනීපාරක්ෂක තුවා සඳහා අමුද්‍රව්‍ය	77.8	55.5	11.6
• අනෙකුත් විවිධ අයිතම	909.1	1,322.5	868.1
• වරාය නගර තීරු බදු රහිත සාප්පු - ආනයන	46	756.5	456.3
එකතුව	**138,425.6**	**144,473.1**	**74,246.9**

මූලාශය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

සටහන: බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය 2024/2025 හි, 19අ වගන්තිය යටතේ ලබාදෙන පොදු නිදහස් කිරීම්වලට අදාළ රේගු ආනයන බද්දෙහි අහිමි වූ ආදායම, ඩීසල් සහ තිරිඟු ධාන්‍ය නිෂ්පාදන සඳහා පමණක් සීමා වී තිබුණි. කෙසේ වෙතත් බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය 2025/2026 හිදී, මෙම පොදු නිදහස් කිරීම්වලට අදාළ රේගු ආනයන බද්දෙහි අහිමි වූ ආදායම්වල විෂය පථය පුළුල් කරමින්, පෙට්‍රල් සහ උණ බම්බු කුරු ඇතුළු තවත් නිෂ්පාදන කිහිපයක් ඊට ඇතුළත් කරන ලදී. මේවා රේගු දන්ත පද්ධතියේ ද හඳුනාගෙන ඇත. ඒ අනුව, මීට පෙර ප්‍රකාශයට පත් කරන ලද දන්ත හා සසඳන විට, 2024 සහ 2025 වර්ෂවලට අදාළ දත්ත සංශෝධනය කර ඇත.

(අ) - සංශෝධිත

(ආ) - තාවකාලික

2.7 මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද

2023 පෙබරවාරි 10 දිනැති අංක 2318/53 දරන ගැසට් නිවේදනය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්දෙන් නිදහස් කිරීම් ලබා දී ඇති අතර, එම සහන කාලය 2024 ජනවාරි 24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය මඟින් තවදුරටත් දීර්ඝ කරන ලදී. මෙම සහන 2024 වසරේ සැප්තැම්බර් 30 දින දක්වා ක්‍රියාත්මක විය. ඉහත ගැසට් නිවේදනවල නියම කර ඇති පරිදි, 2024 සැප්තැම්බර් 30 දිනට පෙර තම වාහන ලියාපදිංචි කිරීමට අපොහොසත් වූ බලපත්‍රලාභීන්ට ලබා දී තිබූ මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු සහන අයකර ගැනීම, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ (COPA) උපදෙස් අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කරනු ලබයි.

2026 වසරේ අගෝස්තු 31 දින වන විට සිදු කර ඇති අයකර ගැනීම් සැලකිල්ලට ගනිමින්, 2023 වසර සහ 2024 වසර සඳහා වූ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්දට අදාළ ඇස්තමේන්තුගත බදු ආදායම් අභිමිවීම සංශෝධනය කර ඇත. ඒ අනුව, බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය 2024/2025 වාර්තාවේ සඳහන් 2023 වසරට අදාළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 162 සිට 159 දක්වා ද, ඇස්තමේන්තුගත බදු ආදායම් අභිමිවීම රු. මිලියන 491 සිට රු. මිලියන 480 දක්වා ද අඩු වී ඇත. එසේම, 2024 වසරට අදාළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 721 සිට 662 දක්වා ද, ඇස්තමේන්තුගත බදු ආදායම අභිමිවීම රු. මිලියන 1,928 සිට රු. මිලියන 1,800 දක්වා ද අඩු වී ඇත. නියමිත කාලසීමාව තුළ තම වාහන ලියාපදිංචි කිරීමට අපොහොසත් වූ බලපත්‍රලාභීන්ට ලබා දී තිබූ මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු සහන අයකර ගැනීමේ බලපෑම පිළිබිඹු වන පරිදි මෙම සංශෝධිත සංඛ්‍යා බදු ආදායම් අභිමිවීම් පිළිබඳ ප්‍රකාශය 2025/2026 සඳහා ඇතුළත් කර ඇත.

වගුව 2.15 : මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු ආදායම් අභිමි වීම

රු. මිලියන

වර්ෂය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අභිමිවන බදු ආදායම
2023(අ)	**159**	**480**
2024(අ)	**662**	**1,800**

මූලාශය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
සටහන: 2026 අගෝස්තු 31 දිනට යාවත්කාලීන කරන ලදී.
(අ) - තාවකාලික

2.8 නිගමනය

අවසාන වශයෙන්, මෙම පරිච්ඡේදය මඟින් විවිධ බදු වර්ග යටතේ පවතින බදු ව්‍යදම්වල ප්‍රමාණය, සංයුතිය සහ රාජ්‍ය මූල්‍යමය වැදගත්කම පිළිබඳ සමස්ත විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. 2024/25 තක්සේරු වර්ෂය තුළ සංස්ථාපිත ආදායම් බදු සහ පුද්ගල ආදායම් බදු යටතේ බදු ආදායම් අභිමිවීමේ කැපී පෙනෙන වැඩිවීමක් මෙම ඇස්තමේන්තු මඟින් පෙන්වා දෙයි. එසේම, සහනදායී බදු අනුපාත සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ මෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන සමාගම් සඳහා ලබා දී ඇති බදු නිදහස් කිරීම්, තොග සහ සිල්ලර වෙළෙඳ කටයුතු, දේශීයව එකලස් කරන ලද වාහන සහ රේගු ආනයන බද්ද යටතේ ලබා දී ඇති බදු සහන හා නිදහස් කිරීම් ඇතුළු බදු ආදායම අභිමිවීම්වල ප්‍රධාන මූලාශ්‍ර ද මෙම විශ්ලේෂණය මඟින් හඳුනාගෙන ඇත. මෙම සොයාගැනීම් මඟින් විවිධ බදු උපකරණ සහ ආර්ථික අංශ හරහා බදු සහන ක්‍රියාමාර්ගවල රාජ්‍ය මූල්‍යමය බලපෑම් එකිනෙකට වෙනස් වන ආකාරය පැහැදිලි වේ.

බදු ආදායම් අභිමිවීම නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමේ, ඒවායේ ප්‍රතිපත්තිමය ඵලදායීතාව ඇගයීමේ සහ ඒවායේ රාජ්‍ය මූල්‍ය පිරිවැය පුළුල් රාජ්‍ය ආදායම් රැස්කිරීමේ අරමුණුවලට අනුකූල බව සහතික කිරීමේ වැදගත්කම මෙම විශ්ලේෂණය මඟින් අවධාරණය කරයි. වාර්තාකරණ කාලසීමාවන්හි පවතින වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, කාලයත් සමඟ බදු ආදායම අභිමිවීම්වල සංයුතිය සහ ඒවායේ වෙනස්වීම් ඇගයීම සඳහා මෙම සොයාගැනීම් පදනමක් සපයයි. අයවැය විනිවිදභාවය තවදුරටත් ඉහළ නැංවීම සහ දැනුවත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම අරමුණු කරගනිමින්, ඊළඟ පරිච්ඡේදය තුළ එක් එක් බදු ක්‍රියාමාර්ගයට අදාළ නීතිමය විධිවිධාන, ඇස්තමේන්තුගත රාජ්‍ය මූල්‍ය පිරිවැය සහ අපේක්ෂිත ප්‍රතිපත්තිමය අරමුණු විස්තරාත්මකව දක්වන බදු ආදායම් අභිමිවීම පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් ඉදිරිපත් කරයි.

III වන කොටස

බදු ආදායම් අභිමිවීම පිළිබඳ ඇස්තමේන්තු

3 වන පරිච්ඡේදය - බදු ආදායම අභිමිවීම් පිළිබඳ සම්පූර්ණ ලේඛනය

ශ්‍රී ලංකාවේ බදු ක්‍රමය තුළ හඳුනාගෙන ඇති බදු ආදායම් අභිමිවීම් පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කෙරේ. බදු නිදහස් කිරීම්, අඩු කිරීම්, බදු බැර, විලම්භනය කිරීම් සහ වරණීය බදු අනුපාත ඇතුළු මූලික බදු ක්‍රමයෙන් අපගමනය වන එක් එක් ප්‍රතිපාදනය පිළිබඳ තොරතුරු ඒකාබද්ධ කර ඇත. එක් එක් සටහන මඟින් ඊට අදාළ නීතිමය යොමුව, අහිමි වූ ඇස්තමේන්තුගත ආදායම (අදාළ අවස්ථාවල දී) සහ ඊට පදනම් වූ ප්‍රතිපත්තිමය අරමුණ දක්වා ඇත. රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ලේඛනය වැදගත් මෙවලමක් වේ. මෙමඟින්, සමස්ත ආදායම් රාමුව තුළ පවතින බදු දිරිගැන්වීම්වල විෂය පථය, සංයුතිය සහ ප්‍රතිපත්තිමය අනුකූලතාව තක්සේරු කිරීම් සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ඉඩ සලසා දෙනු ඇත.

3.1 : සංස්ථාපිත ආදායම් බද්දෙන් අහිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය

නම	**ආදායම් බදු පනත යටතේ සහනදායී අනුපාත.**		
විස්තරය	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි පළමු උපලේඛනයේ 4 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති සහනදායී අනුපාත යටතේ සමාගමක ඉපයීම් හා ලාභ මත බදු අය කරනු ලැබේ.		
බදු වර්ගය	සංස්ථාපිත ආදායම් බද්ද		
ප්‍රතිලාභීන්	සමාගම්		
බදු සහන වර්ගය	වරණීය අනුපාත		
නෛතික යොමුව	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පළමු උපලේඛනයේ 4 වන වගන්තිය - සමාගම් සඳහා බදු අනුප්‍රමාණ		
අරමුණු	තෝරාගත් අංශවල ආයෝජන දිරිමත් කිරීමට සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025(අ)**	**2025/2026**
	114,422	118,508	-

(අ) - තාවකාලික

නම	**ආයෝජන මණ්ඩල පනත යටතේ සහනදායී අනුපාත.**		
විස්තරය	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී ඇති සමාගම් සඳහා ලබා දී ඇති සහනදායී සංස්ථාපිත ආදායම් බදු අනුපාත.		
බදු වර්ගය	සංස්ථාපිත ආදායම් බද්ද		
ප්‍රතිලාභීන්	සමාගම්		
බදු සහන වර්ගය	වරණීය අනුපාත		
නෛතික යොමුව	1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව නීතිය		
අරමුණු	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්වලට එළඹෙන ව්‍යවසායයන් සඳහා තරඟකාරී බදු සහන ලබා දීමෙන් දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025(අ)**	**2025/2026**
	41,682	11,604	-

(අ) - තාවකාලික

නම	**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ නිදහස් කිරීම්.**		
විස්තරය	කෘෂිකර්මාන්තය, කෘෂි සැකසුම්, කාර්මික සහ යාන්ත්‍රික මෙවලම් නිෂ්පාදනය, යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය, ඉලෙක්ට්‍රෝනික උපකරණ, සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය හෝ තොරතුරු තාක්ෂණය සහ ඒ ආශ්‍රිත සේවාවන්හි නියැලී සිටින ඕනෑම සමාගමක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.		
බදු වර්ගය	සංස්ථාපිත ආදායම් බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයන් හෝ ආයතන		
බදු සහන වර්ගය	බදු අඩු කිරීම		
නෛතික යොමුව	2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17 වන වගන්තිය		
අරමුණු	ඉහත සඳහන් නිශ්චිත අංශයන්හි ආයෝජන දිරිමත් කිරීම		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024(අ)**	**2024/2025(ආ)**	**2025/2026**
	4,725	67,561	-

(අ) - සංශෝධිත
(ආ) - තාවකාලික

නම	**වරාය නගරය ව්‍යාපෘති සඳහා ලබා දී ඇති නිදහස් කිරීම්.**		
විස්තර	කොළඹ වරාය නගරය තුළ ක්‍රියාත්මක වන සමාගම්වල ලාභය සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.		
බදු වර්ගය	සංස්ථාපිත ආදායම් බදු		
ප්‍රතිලාභීන්	ආයතන		
මිනුම් වර්ගය	නිදහස් කිරීම්		
නීතිමය යොමුව	2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත		
අරමුණ	කොළඹ වරාය නගරය තුළ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025**	**2025/2026**
	143	-	-

නම	**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති නිදහස් කිරීම්.**		
විස්තර	ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති ලෙස නම් කර ඇති සමාගම්වල ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.		
බදු වර්ගය	සංස්ථාපිත ආදායම් බදු		
ප්‍රතිලාභීන්	ආයතන		
මිනුම් වර්ගය	නිදහස් කිරීම්		
නීතිමය යොමුව	2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත		
අරමුණ	ආයෝජන ප්‍රවර්ධනය කිරීම		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025**	**2025/2026**
	123	-	-

3.2 : පුද්ගල ආදායම් බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය

නම	**කුලී ආදායම සඳහා සහන**		
විස්තරය	නේවාසික පුද්ගලයින් සතු ආයෝජන වත්කම් සඳහා කුලී සහන : තක්සේරු වර්ෂය සඳහා ලැබෙන දළ කුලී ආදායමෙන් සියයට 25ක අඩු කිරීමක්.		
බදු වර්ගය	පුද්ගල ආදායම් බදු		
ප්‍රතිලාභීන්	පුද්ගලයින්		
බදු සහන වර්ගය	බදු බැර		
නෛතික යොමුව	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනය - සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන		
අරමුණු	නිවාස අංශයේ පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම සහ කුලී ආදායම උත්පාදනය කිරීමේ දී දරනු ලබන නඩත්තු සහ ඒ ආශ්‍රිත වියදම්වලින් කොටසක් අඩු කිරීමට ලබා දීම මඟින් කුලී ආදායම විධිමත් ලෙස වාර්තා කිරීම දිරිගැන්වීම සඳහාත් මෙය සිදු කෙරේ.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025(අ)**	**2025/2026**
	7,253	2,034	-

(අ) - තාවකාලික

නම	**සූර්ය පැනල සඳහා වන වියදම් සඳහා ලබා දෙන සහන.**		
විස්තරය	තම පරිශ්‍රයේ සූර්ය පැනල සවි කර, ඒවා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇති වාසික පුද්ගලයෙකුට, සෑම තක්සේරු වර්ෂයක් සඳහා රු. 600,000/-ක් දක්වා වූ බදු අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු ලබන අතර, මෙම අඩු කිරීම සඳහා වන සමුච්චිත සීමාව, එම සූර්ය පැනල ලබා ගැනීම සඳහා වූ මුළු වියදමට හෝ ඒවා ලබා ගැනීම සඳහා ලබාගත් ඕනෑම ණය මුදලක් සම්බන්ධයෙන් බැංකුවකට ගෙවන ලද මුදලට සමාන විය යුතුය.		
බදු වර්ගය	පුද්ගලික ආදායම් බදු		
ප්‍රතිලාභීන්	පුද්ගලයින්		
බදු සහන වර්ගය	බදු බැර		
නෛතික යොමුව	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනය - සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන		
අරමුණු	ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ සූර්ය පැනල සවි කිරීම සඳහා බදු සහන ලබා දීම මඟින්, නිවාස මට්ටමින් පුනර්ජනනීය බලශක්තිය භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025(අ)**	**2025/2026**
	2,270	1,720	-

(අ) - තාවකාලික

නම	**සුදුසුකම් ලබන ගෙවීම්.**		
විස්තරය	දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 1 වන වගන්තියට අනුව කරන ලද පරිත්‍යාග, තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයෙකුගේ හෝ ආයතනයක බදු අය කළ හැකි ආදායම තීරණය කිරීමේ දී අඩු කරනු ලැබිය හැකිය.		
බදු වර්ගය	පුද්ගල ආදායම් බදු		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	බදු අඩු කිරීම		
නෛතික යොමුව	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනය - සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන		
අරමුණු	අනුමත පුණ්‍ය, ආගමික, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ සහ පුද්ගල දායකත්වය දිරිමත් කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2023/2024**	**2024/2025(අ)**	**2025/2026**
	938	170	-

(අ) - තාවකාලික

3.3 එකතු කළ අගය මත බද්දෙන් අභිමිවන බදු ආදායම් පිළිබඳ ලේඛනය

නම	**තිරිඟු සහ තිරිඟු පිටි සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	තිරිඟු සහ තිරිඟු පිටි සැපයීම හෝ ආනයනයේ දී එකතු කළ අගය මත බද්ද නිදහස් කර ඇත.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ළඳරු කිරිපිටි සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	ළඳරු කිරිපිටි සැපයීම හෝ ආනයනයේ දී එකතු කළ අගය මත බද්ද නිදහස් කර ඇත.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ඖෂධ නිෂ්පාදන සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	ඖෂධීය නිෂ්පාදන සහ ඖෂධ (රූපලාවන්‍ය නිෂ්පාදන හැර) සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර ඇති අතර අදාළ නිෂ්පාදන හෝ ඖෂධ, රෝග සුව කිරීමට (therapeutic) හෝ රෝග වැළැක්වීමට (prophylactic) පමණක් භාවිත විය යුතු අතර, වෛද්‍යවරයෙකුගේ නිර්දේශය (prescription) මත මිල දී ගත් ඒවා විය යුතුය. තවද, එවැනි නිෂ්පාදන හෝ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ද මෙම බදු නිදහස් කිරීමට අයත් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තු (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ආයුර්වේද ඖෂධ සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිර්දේශය සහිතව රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් ආයුර්වේද ඖෂධ නිසන්ඩුවට අයත් ආයුර්වේද සංයෝග (රූපලාවන්‍ය සම්මිශ්‍රණ) හෝ යුනානි, සිද්ධ හෝ හෝමියෝපති සංයෝග (රූපලාවන්‍ය සම්මිශ්‍රණ) සහ එම සංයෝග සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**පිරිපහදු නොකරන ලද ඛනිජ තෙල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන, නැව් සඳහා භාවිතා කරන තෙල් හෝ ඉන්ධන සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	පිරිපහදු නොකරන ලද ඛනිජ තෙල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන, නැව් සඳහා භාවිතා කරන තෙල් හෝ රේගු කටයුතු සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2710.19.60 යටතේ නිශ්චිතව දක්වන ලද ඉන්ධන සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**මිනිස් සිරුරේ පළඳින හෝ රැගෙන යන හෝ තැන්පත් කරන ලද එවැනි ආධාරක හෝ උපකරණ සඳහා උපාංග සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	කෘතිම අත්පා, කිහිළිකරු, රෝද පුටු, ශ්‍රවණ ආධාරක, එවැනි ආධාරක සඳහා වන උපාංග හෝ විකලතාවයක් හෝ ආබාධිත තත්ත්වයක් සඳහා මිනිස් සිරුරේ පළඳින හෝ රැගෙන යන හෝ මිනිස් සිරුරේ තැන්පත් කරන විශේෂිත උපකරණ, අන්ධ පුද්ගලයන් සඳහා සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන යන්ත්‍ර සහ කොටස්, බ්‍රේල් ලිවීමේ කඩදාසි, බ්‍රේල් යතුරු ලියන පුවරු සහ ඒ සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, අදාළ පුද්ගලයන් විසින් ඉල්ලා සිටින සහනය සලකා බලා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ආබාධිත පුද්ගලයන් විසින් භාවිත කරනු ලබන වෙනත් ඕනෑම භාණ්ඩයක් සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ජෛව පොහොර, ආටිමියා බිත්තර සහ පීට් පාසි සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් ජෛව පොහොර, ආටිමියා බිත්තර සහ පීට් පාසි සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**කෘෂිකාර්මික බීජ, කෘෂිකාර්මික පැළ සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	කෘෂිකාර්මික බීජ, කෘෂිකාර්මික පැළ, ඉස්සන් සඳහා ආහාර ඇතුළුව කුනිස්සන් සඳහා ආහාර සහ කුකුළු ආහාර හැර සත්ත්ව ආහාර සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කරන නූල් සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන නූල් සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කරන ඩයි වර්ග සැපයීම හෝ ආනයනය කිරීම.**		
විස්තර	රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් අත්යන්ත්‍ර කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන වර්ණක සැපයීම හෝ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**අධ්‍යාපන සේවා සැපයීම.**		
විස්තර	යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් සපයනු ලබන අධ්‍යාපනික සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම.**		
විස්තර	පොදු මගී ප්‍රවාහන සේවා (ගුවන් ප්‍රවාහනය, ජලය මඟින් ප්‍රවාහනය හෝ සංචාරකයින් ප්‍රවාහනය කිරීම, විනෝද චාරිකා සහ කුලී රථ සේවා හැර) සැපයීම සඳහා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**විදුලිබලය සැපයීම.**		
විස්තර	බෙදා හැරීම ඇතුළුව විදුලිබලය සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**වෛද්‍ය ආයතන හෝ වෘත්තීය සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් සපයනු ලබන සියලුම සෞඛ්‍ය සේවා සැපයීම.**		
විස්තර	රෝහල් කාමර ගාස්තු හැර සෞඛ්‍යාරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සපයනු ලබන සියලු සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**දේශීයව නිෂ්පාදනය කරන ලද අත්යන්ත්‍ර රෙදිපිළි සැපයීම.**		
විස්තර	දේශීයව නිෂ්පාදනය කරන ලද අත්යන්ත්‍ර රෙදිපිළි සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**දේශීයව නිෂ්පාදනය කරන සහල්, සහල් පිටි සහ පාන් වැනි නිෂ්පාදන සැපයීම.**		
විස්තර	සහල්, සහල් පිටි සහ පාන් සැපයීමේදී එම නිෂ්පාදන දේශීය වශයෙන් නිෂ්පාදනය කරන තාක් දුරට, එකතු කළ අගය මත බද්ද නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**නිෂ්පාදනය කරන ලද සකස් නොකළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ සීවර නිෂ්පාදන සැපයීම.**		
විස්තර	ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද පිරිසැකසුම් නොකළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ මත්ස්‍ය නිෂ්පාදන සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**දේශීයව නිෂ්පාදනය කරන ලද ශල්‍යකර්ම දැල් රෙදි (ගෝස්) සැපයුම.**		
විස්තර	ශල්‍යකර්ම සඳහා භාවිතා කරන දේශීයව නිෂ්පාදිත ශල්‍යකර්ම දැල් රෙදි (ගෝස්) සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හේතු වන සේවා සැපයීම.**		
විස්තර	නූල්, රෙදිපිළි හෝ ඇඟළුම් නිෂ්පාදන අපනයනය කරන්නන් හැර වෙනත් යම් තැනැත්තන් වෙත සපයනු ලබන සේවාවන් වන තාක් දුරට නූල්, රෙදිපිළි හෝ ඇඟළුම්වල තත්ත්වය, ගති ලක්ෂණ හෝ වටිනාකම ප්‍රවර්ධනය වීමක් සේවාවන් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**වයෝවෘද්ධ සේවා සහ ළමා සත්කාරක සේවා සැපයීම.**		
විස්තර	වයෝවෘද්ධ සේවා සහ ළමා සත්කාරක සේවා සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවාවන්හි මිල අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති ඕනෑම ව්‍යාපෘතියකට භාණ්ඩ හෝ සේවා සැපයීම.**		
විස්තර	2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති යම් ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ආයෝජන ප්‍රවර්ධනය කිරීමට.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**අමාත්‍යවරයා විසින් හඳුනාගත් ඕනෑම විශේෂිත ව්‍යාපෘතියකට භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ ඕනෑම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියකට භාණ්ඩ හා සේවා සැපයීම.**		
විස්තර	• බදු ගෙවීම රජය විසින් දරනු ලබන සහ රටෙහි ආර්ථිකමය ප්‍රතිලාභය පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හා සේවා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ. • අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි ශ්‍රී ලංකා රජයේ යම් අමාත්‍යාංශයක් වෙත විදේශ ණය හෝ පරිත්‍යාග වශයෙන් අරමුදල් සපයන යම් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හා සේවා සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	රජයට දැරීමට සිදුවන ව්‍යාපෘතියේ මූලික පිරිවැය අවම කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ගුවන් යානා එන්ජින් හෝ ගුවන් යානා අමතර කොටස් ආනයනය කිරීම.**		
විස්තර	රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති ගුවන් යානා එන්ජින් හෝ ගුවන් යානා අමතර කොටස් ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජාත්‍යන්තර ප්‍රවාහන සේවා සැපයීමේ තරහකාරිත්වය තහවුරු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රසායනික නැෆ්තා ආනයනය කිරීම.**		
විස්තර	විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයනු ලැබීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සපයනු ලබන රසායනික නැෆ්තා ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත - පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	විදුලිබල උත්පාදන පිරිවැය අවම කිරීම සඳහා.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**වරාය නගරය ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩ ආනයනය - නැවත භාවිතා කළ හැකි.**		
විස්තර	2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වරාය නගරයට ලබා දී ඇති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	කොළඹ වරාය නගරය		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත		
අරමුණ	ආයෝජන ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024(අ)**	**2025**	**2026.01.01 - 2026.06.30**
	52	-	-

(අ) - සංශෝධිත

නම	**වරාය නගරය තීරුබදු රහිත සාප්පු - ආනයන.**		
විස්තර	වරාය නගරය තීරුබදු රහිත සාප්පු සඳහා වන ආනයන සඳහා ලබා දී ඇති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්.		
බදු වර්ගය	එකතු කළ අගය මත බදු		
ප්‍රතිලාභීන්	ආයතන		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත		
අරමුණ	කොළඹ වරාය නගරය තුළ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024(අ)**	**2025**	**2026.01.01 - 2026.06.30**
	142.1	-	-

(අ) - සංශෝධිත

නම	**දේශීයව නිෂ්පාදිත නැවුම් කිරි භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද දියර කිරි සහ යෝගට් සැපයීම.**		
විස්තර	දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කරනු ලබන දියර කිරි සහ යෝගට්		
බදු වර්ගය	එකතු කල අගය මත බදු		
ප්‍රතිලාභීන්	අවසාන පාරිභෝගිකයා		
මිනුම් වර්ගය	නිදහස් කිරීම		
නීතිමය යොමුව	2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III කොටස		
අරමුණ	ජීවන වියදම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් අඩු කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

3.4 : සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් අභිමුවන බදු ආදායම් පිළිබඳ ලේඛනය

නම	**නිෂ්පාදකයා විසින් අපනයනය කරනු ලබන නිදහස් කර ඇති යම් ද්‍රව්‍යයක්.**		
විස්තරය	නිෂ්පාදකයා විසින් අපනයනය කරනු ලබන යම් ද්‍රව්‍යයක් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කෙරේ.		
බදු වර්ගය	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	නිදහස් කිරීම		
නෛතික යොමුව	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ Iඅ කොටස		
අරමුණු	අපනයන ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**අනන්‍ය ලෙස භාවිත කිරීමට යම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ තිරවුරු නොවන නිදහස් කරන ලද ද්‍රව්‍ය.**		
විස්තරය	අපනයනය කිරීම සඳහා යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේදී හෝ ඒ සඳහා අනන්‍ය ලෙස භාවිත කිරීමට යම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ තිරවුරු නොවන යම් ද්‍රව්‍යයක් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	නිදහස් කිරීම		
නෛතික යොමුව	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ Iඅ කොටස		
අරමුණු	අපනයන ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**බදු අයකළ හැකි තැනැත්තෙකු විසින් යම් අපනයනකරුවෙකුට විකුණන ලද නිදහස් කරන ලද ද්‍රව්‍යය.**		
විස්තරය	බදු අයකළ හැකි තැනැත්තෙකු විසින් යම් අපනයනකරුවෙකුට විකුණන ලද යම් ද්‍රව්‍යයක් හෝ එම ද්‍රව්‍යය කොටසක් වන සේ නිෂ්පාදිත වෙනත් යම් ද්‍රව්‍යයක්, එම අපනයනකරු විසින් සෘජුව ම හෝ අපනයන කාර්ය සඳහා පිහිටුවන ලද වෙළෙඳ ආයතනයක් හරහා ඇත්ත වශයෙන් ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ බවට යම් ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීම මත කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් එම ද්‍රව්‍ය සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	නිදහස් කිරීම		
නෛතික යොමුව	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ Iඅ කොටස		
අරමුණු	අපනයන ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**යම් ගුවන් සේවයක් හෝ නැව් සමාගමක් විසින් ආනයනය කරනු ලබන නිදහස් කරන ලද යම් අමතර කොටසක්.**		
විස්තරය	යම් ගුවන් සේවයකට හෝ නැව් සමාගමකට අයත් හෝ අධිකාරියකට යටත් ජාත්‍යන්තර ගමනාගමනයේ යෙදෙන යම් ගුවන් යානයක හෝ නැවක නඩත්තුව සඳහා භාවිතා කරනු ලැබීම සඳහා බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් යම් ගුවන් සේවයක් හෝ නැව් සමාගමක් විසින් ආනයනය කරනු ලබන යම් අමතර කොටසක් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	නිදහස් කිරීම		
නෛතික යොමුව	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ Iඅ කොටස		
අරමුණු	ජාත්‍යන්තර ගමනාගමන සේවා තරගකාරිත්වය සහතික කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**නිදහස් කරන ලද පොහොර ද්‍රව්‍ය.**		
විස්තරය	පොහොර සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	නිදහස් කිරීම		
නෛතික යොමුව	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ Iඅ කොටස		
අරමුණු	කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීම.		
දත්ත මූලාශ්‍රය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය	මෙම මිනුම් පිරිවැය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද පරිපාලනමය දත්ත නිරූපණය කරයි.		
ඇස්තමේන්තුව (රු. මිලියන)	**2024**	**2025**	**2026.01.01 - 2026.06.30**
	-	-	-

නම	**නිදහස් කරන ලද ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන ද්‍රව්‍යය.**		
විස්තරය	රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද ලිහිසි ද්‍රව්‍ය හැර ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් වේ.		
බදු වර්ගය	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද		
ප්‍රතිලාභීන්	පුද්ගලයින් සහ ආයතන		
බදු සහන වර්ගය	නිදහස් කිරීම		
